


TRANSPARENCY INTERNATIONAL SRI LANKA

a nation that upholds integrity

# සුපිළිපන්භාවය හා තාරුණ්‍යය

## සමීක්ෂණ වාර්තාව



ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා යනු දූෂණය මැඬලීම සිය මූලික අරමුණ කරගනිමින් ක්‍රියාත්මක වන ලොව ප්‍රමුඛතම ජාත්‍යන්තර සංවිධානයක් වන ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල්හි ශ්‍රී ලාංකික නියෝජිතායතනයයි. ලොව පුරා රටවල් රැසක ශාඛා සියයකට අධික ප්‍රමාණයක් ක්‍රියාත්මක වන ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් සමස්ත ජාලයම විනිවිදභාවය, වගවීම හා යහපාලන ප්‍රතිපත්ති ප්‍රවර්ධනය වෙනුවෙන් කැප වී ක්‍රියා කරයි.

ISBN - 978-955-1281-59-5

©2013 ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා
සියළුම හිමිකම් ඇවිරිණි

පිටු සැකැසුම - හරිත දහනායක
ඡායාරූප - හසික කුලතුංග



# සුපිළිපන්භාවය හා තාරුණ්‍යය

## සමීක්ෂණ වාර්තාව

ජුලි 2013

# පටුන


කෙටි යෙදුම් 01

රූපසටහන් පෙළගැස්ම 01

පණිවුඩ 02

**විධායක සම්පිණ්ඩණය 05**

- ප්‍රධානතම සොයාගැනීම් 06
- නිගමන සහ නිර්දේශ 08

**හඳුන්වාදීම 11**

**ක්‍රමවේදය 13**

- ප්‍රශ්නාවලිය සැලසුම් කිරීම 13
- ක්ෂේත්‍ර කටයුතු 15

**ප්‍රධාන අනාවරණයන් 17**

- සුපිළිපන්භාවයෙහි වැදගත්කම පිළිබඳ දැක්ම 17
- දූෂණය පිළිබඳ අත්දැකීම් 25
- පරිසරය සහ සුපිළිපන්භාවය පිළිබඳ ක්‍රියා 34

**නිගමන සහ නිර්දේශ 41**

- නිගමන 41
- නිර්දේශ 44

පසු සටහන් 48

## කෙටි යෙදුම්

| | |
|---|---|
| A/L | : Advanced Level - උසස් පෙළ - උ. පෙ. |
| DS | : Divisional Secretary - ප්‍රාදේශිය ලේකම් - ප්‍රා. ලෙ. |
| GCE | : General Certificate Examination - අධ්‍යාපන පොදු සහතික පත්‍ර - අ. පො. ස. |
| O/L | : Ordinary Level - සාමාන්‍ය පෙළ - සා. පෙ. |
| NYSC | : National Youth Services Council- ජාතික තරුණ සේවා සභාව |
| TIS | : Transparency International Secretariat - ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ලේකම් කාර්යාලය |
| TISL | : Transparency International Sri Lanka - ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා |
| TV | : Television - රූපවාහිනිය |
| YIS | : Youth Integrity Survey - තාරුණ්‍යයේ සුපිළිපන්භාවය පිළිබඳ සමීක්ෂණය |

## රූපසටහන් ලැයිස්තුව


| අංකය | | පිටු අංකය |
|---|---|---|
| A.1: | සාර්ථකත්වය සඳහා සුපිළිපන්භාවය - ස්ත්‍රී පුරුෂ භාවය අනුව | 06 |
| A3.1: | දූෂණය පිළිබඳ තොරතුරු ලබාගැනීමේ හැකියාව - තරුණ සහ වැඩිහිටි ප්‍රතිශතයක් ලෙස | 08 |
| B.1: | ශ්‍රී ලංකාවේ සියලුම පළාත් ආවරණය වන පරිදි දිස්ත්‍රික් 10 කින් අහඹුලෙස තෝරාගන්නා ලද තරුණ තරුණියන් 1004ක් සහ වැඩිහිටියන් 1012ක් | 15 |
| B.2: | ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික් සිතියම - සමීක්ෂණය පැවැත්වූ දිස්ත්‍රික්ක | 15 |
| A 1.1: | සුපිළිපන්භාවය නොමැතිවීම බරපතල ගැටලුවක් ලෙස | 17 |
| A 1.2: | සුපිළිපන්භාවය නොමැතිවීම බරපතල ගැටලුවක් ලෙස (ස්ත්‍රී පුරුෂ) | 18 |
| A 1.3: | සුපිළිපන්භාවය නොමැතිවීම බරපතල ගැටලුවක් ලෙස (නාගරික සහ ග්‍රාමීය) | 18 |
| A 1.4: | ඇය/ඔහු කිසිවිටෙකත් බොරු නොකරන/ වංචා නොකරන නිසා සුපිළිපන්භාවය ඇතිවෙයි | 19 |
| A 1.5: | ඇය/ඔහු කිසිවිටෙකත් නීතිය නොකඩන නිසා සුපිළිපන්භාවය ඇතිවෙයි | 19 |
| A 1.6: | ඇය/ඔහු කිසිදිනෙක දූෂණයට සම්බන්ධ නොවන නිසා සුපිළිපන්භාවය ඇතිවෙයි | 19 |
| A 2.1: | ඇය/ඔහු කිසිදිනෙක දූෂණයට සම්බන්ධ නොවන නිසා සුපිළිපන්භාවය ඇතිවෙයි | 20 |
| A 2.2: | වඩාත් වැදගත් වන්නේ ආදායම වැඩිකර ගැනීමද? අවංක හා නීතිගරුකවීමද? | 21 |
| A 3.1: | සුපිළිපන්භාවය ඇති අය වංචනිකයන්ට වඩා සාර්ථකවන්නේද? | 22 |
| A 3.2: | සුපිළිපන්භාවය ඇති අය වංචනිකයන්ට වඩා සාර්ථකවන්නේද? (අධ්‍යාපන මට්ටමට අනුව) | 22 |
| A 4.1: | වංචාව හෝ බොරු කීම නොකරන විට පාඩු සිදුවන අවස්ථාකදී ඔවුන්ගේ සුපිළිපන්භාවය පිළිබඳ දැක්ම | 23 |
| A 4.2: | නීතියට පිටුපෑමට වඩා පවුලේ සමගිය අගයකරන පුද්ගලයෙකුගේ සුපිළිපන්භාවය පිළිබඳ දැක්ම | 23 |
| A 4.3: | සුපිළිපන්භාවය සහිත පුද්ගලයෙකු දූෂණයේ යෙදෙන්නේ වියදම අවම වූ විටය | 24 |
| A 4.4: | බොරුකියන/වංචාකරන/ නීතියට වඩා පවුල අගයන හෝ සුළු අල්ලස් ලබාදෙන අයගේ සුපිළිපන්භාවය පිළිබඳ නාගරික සහ ග්‍රාමීය දෘෂ්ඨිකෝණයෙන් වූ දැක්ම | 24 |
| B.1: | ප්‍රදේශ හයක තරුණ සහ වැඩිහිටි අය අතර දූෂණය පිළිබඳ අත්දැකීම් | 25 |
| B.2: | තරුණ සහ වැඩිහිටි අය අතර දූෂණය පිළිබඳ අත්දැකීම් සංසන්දනය - ස්ත්‍රීපුරුෂභාවය අනුව | 26 |
| B.1 -1: | රාජ්‍ය ආයතනවල සමස්ථ ක්‍රියාකාරිත්වය පිළිබඳ දැක්ම | 27 |
| B.1 -2: | විවිධ රාජ්‍ය සේවා ආයතනවල සුපිළිපන්භාවය පිළිබඳ දැක්ම | 27 |
| B.2 -1: | කිසියම් ප්‍රයෝජනයක් ලබාගැනීම සඳහා දූෂිත ගනුදෙනුවක නියැලීමට ඇති කැමැත්ත | 28 |
| B.3 -1: | වංචාකර සමත්වනවාට වඩා විභාගයක් අසමත්වීමට ඇති කැමැත්ත | 29 |
| B.3 -2: | වංචාකර සමත්වනවාට වඩා විභාගයක් අසමත්වීමට ඇති කැමැත්ත - ස්ත්‍රීපුරුෂභාවය අනුව | 29 |
| B.3 -3: | වංචාකර සමත්වනවාට වඩා විභාගයක් අසමත්වීමට ඇති කැමැත්ත - පදිංචිය අනුව | 30 |
| B.4-1: | වැදගත් ලිපිලේඛන ලබාගැනීම සඳහා අල්ලස් ලබාදීමට ඇති කැමැත්ත- ස්ත්‍රීපුරුෂභාවය අනුව | 31 |
| B.4-2: | වැදගත් ලිපිලේඛන ලබාගැනීම සඳහා අල්ලස් ලබාදීමට ඇති කැමැත්ත - පදිංචිය අනුව | 31 |
| B.5-1: | සදාචාර නොවන අයුරින් රැකියාවකට හෝ පාසැල් ඇතුල්වීමකට ඇති කැමැත්ත - පදිංචිය අනුව | 32 |
| B.6-1: | සදාචාර නොවන අයුරින් 'අපේක්ෂිත රැකියාව' ලබාගැනීමට ඇති කැමැත්ත | 33 |
| C.1: | දූෂණය දුරුකිරීම සඳහා වන තරුණ තරුණියන්ගේ භූමිකාව - තරුණයින් සහ වැඩිහිටියන් අතර | 34 |
| C.2: | දූෂණය දුරුකිරීම සඳහා වන තරුණ තරුණියන්ගේ භූමිකාව - තරුණ තරුණියන් සහ වැඩිහිටියන් අතර පදිංචිය අනුව | 34 |
| C.3: | දූෂණය වාර්තා කිරීමට ඇති කැමැත්ත - තරුණයින් සහ වැඩිහිටියන් අතර | 35 |
| C.4: | දූෂණයට එරෙහිව කථා නොකිරීමට හේතු- ස්ත්‍රීපුරුෂභාවය අනුව | 36 |
| C.5: | තරුණයින් සහ වැඩිහිටියන් සඳහා තොරතුරු ලැබෙන මූලාශ්‍රයන් | 37 |
| C.6: | තරුණයින් සහ වැඩිහිටියන් අතර ශ්‍රී ලංකාවේ දූෂණය හා සම්බන්ධ නීති රාමුව පිළිබඳව ඇති දැනුම | 37 |
| C.7: | තරුණයින් සහ වැඩිහිටියන් අතර ශ්‍රී ලංකාවේ දූෂණය හා සම්බන්ධ නීති රාමුව පිළිබඳව ඇති දැනුම - අධ්‍යාපන මට්ටම අනුව | 38 |

# ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා

## විධායක අධ්‍යක්ෂවරයාගේ පණිවුඩය

ලොව පුරා දූෂණය තුරන් කිරීමටත් අවංකභාවය සහ යහපාලනය ප්‍රවර්ධනය කිරීමටත් කැපවී සිටින ජාත්‍යන්තර ව්‍යාපාරයක් වන ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ආයතනයේ ශ්‍රී ලංකා ශාඛාව ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයයි (TISL).

දශකයකට පමණ පෙර සිට ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ආයතනය දූෂණයෙන් තොර ශ්‍රී ලාංකික සමාජයක් කරා යන ගමනේදී විවිධ පාර්ශවයන් හා එක්ව කටයුතු කර ඇත. සමාජයේ කාර්යක්ෂම සහ උද්දීප්ත වූ කොටසක් වන යෞවනයන්ට දූෂණයට එරෙහිව කෙරෙන සටනේ වැදගත් කාර්යභාරයක් ඉටුකළ හැකිය. මෙම වැදගත් කාර්යභාරය හඳුනාගත් ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය තම ප්‍රධාන කාර්යාලය මගින් රටවල් ගණනාවක සහභාගීත්වයෙන් සිදුකරන තාරුණ්‍යයේ සුපිළිපන්භාවය පිළිබඳ සමීක්ෂණය ශ්‍රී ලංකාවේද ආරම්භ කරන ලදී. මෙම සමීක්ෂණයට සහභාගීවන අනෙකුත් රටවල් වන්නේ ෆීජි, ඉන්දුනීසියාව සහ දකුණු කොරියාවය.

මෙම සමීක්ෂණය ජාතික තරුණ සේවා සභාවේ සහාය ඇතිව විවෘත විශ්ව විද්‍යාලය මගින් සිදුකරන ලද අතර එහි ප්‍රතිඵල තුළින් ශ්‍රී ලාංකික යෞවනයින් ගේ සුපිළිපන් භාවයේ මට්ටම් පිළිබඳව වටහාග ැනීමට හැකිවනු ඇත. ශ්‍රී ලංකාවේ සියලුම පලාත් නියෝජනය වන පරිදි දිස්ත්‍රික් දහයකින් තරුණයින් 1004 දෙනෙකුගේ නියැදියක් තෝරාගන්නා ලද අතර පාලක කණ්ඩාමක් ලෙස වැඩිහිටියන් 1012 දෙනෙකුද සමීක්ෂණය සඳහා සහභාගී වන ලදී.

තාරුණ්‍යයේ සුපිළිපන්භාවය පිළිබඳ සමීක්ෂණයේදී ලබාගන්නා ලද ප්‍රමුඛ දත්තයන් සහ අනාවරණයන් ප්‍රසිද්ධියට පත් කිරීමට පෙර ඒ පිළිබඳව සමාලෝචනයක් කිරීමට සහ පිටුබලය දියයුතු අංශ හඳුනාගැනීමට සමාලෝචන රැස්වීමක් TISL ආයතනය විසින් පවත්වන ලදී. ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරීන්, ජනමාධ්‍යවේදීන් සහ සිවිල් සමාජ ක්‍රියාකාරීන් මෙම විචාරණය සඳහා සහභාගී වූහ. මෙම සමීක්ෂණයේ ප්‍රතිඵල සහ දත්තයන් මීලඟ පියවරේදී එනම්, යෞවනයන් දූෂණයට එරෙහි සටනට යොමුකරවා ගැනීමට අවශ්‍ය සැලසුම් සකස්කිරීමේදී සාක්ෂි සහිත පදනමක් ලබාදෙනු ඇත.

මෙම සමීක්ෂණයේ පර්යේෂක ලෙස කටයුතුකළ විවෘත විශ්වවිද්‍යාලයේ, ආචාර්ය ශාන්ත අබේසිංහ මහතාට, කැළණිය විශ්ව විද්‍යාලයේ ආචාර්ය නාලක වික්‍රමසිංහ මහතාට සහ ජාතික තරුණ සේවා සභාවේ සභාපතිතුමන් සහ කාර්ය මණ්ඩලයට මෙම සමීක්ෂණය සාර්ථකව අවසන් කරගැනීමට දැක්වූ සහයෝගය පිළිබඳව මාගේ ස්තුතිය සහ කෘතඥතාවය පිරිනමනු කැමැත්තෙමි.

එස් රනුග්ගේ<br>
විධායක අධ්‍යක්ෂ<br>
ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා

# ජාතික තරුණ සේවා සභාවේ
## සභාපති/ අධ්‍යක්ෂ ජෙනරාල්තුමන් ගේ පණිවුඩය

ශ්‍රී ලංකාවේ තරුණ කටයුතු අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ ජාතික තරුණ සේවා සභාවේ: "ශ්‍රී ලංකා තාරුණ්‍යයේ" සභාපතිවරයා වන මම, මෙවැනි ජාතික සමීක්ෂණයකට මුල පිරීම සම්බන්ධයෙන් ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනයට බෙහෙවින් ණයගැති වෙමි. විශේෂයෙන් ම, රට සංවර්ධනය කිරීම සඳහා තරුණයන්ගේ ශක්තිය පන්නර ගැන්වීමට අප කටයුතු කරමින් සිටින කාලයක, රටේ සමාජ-ආර්ථික සංවර්ධනයට බලපාන මෙම සමාජමය බාධාවන් පිළිබඳව තරුණයන් දරන අදහස් අවබෝධ කර ගැනීම අතිශයින් ප්‍රයෝජනවත් වන්නේ ය.

පාලනය, දූෂණය සහ අල්ලස පිළිබඳව තරුණ පරපුර සතු දැනීම අවබෝධ කරගෙන සිටීම, අනාගතයේ දී මෙම බාධාවන් සාර්ථක ලෙස තුරන් කළ හැකි හෝ පිටුදැකිය හැකි වන පරිදි හෙට දින නායකයන් වන වත්මන් තරුණ තරුණියන් දැනුවත් කිරීමට සහ සවි බල ගැන්වීමට ජාතික තරුණ සේවා සභාව වැනි ජාතික ආයතනවලට බෙහෙවින් උපකාරක වනු ඇත. රට තුළ සිටින සෑම තරුණයෙකු ම ඉලක්ක කර ගෙන ජාතික සංවර්ධනයෙහි ලා සක්‍රියව සම්බන්ධ වීමට තරුණයන් බල ගැන්වීමේ ක්‍රියාවලියක "ශ්‍රී ලංකා තාරුණ්‍යය" මේ වන විට නිරතව සිටී.

වර්තමානයේ දී, ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් සැලකිය යුතු කොටසක් (30%කට ආසන්න ප්‍රමාණයක්) පැහැදිලිව ම අවුරුදු 15-29 අතර තරුණ තරුණියෝ වෙති. ඔවුන්ගේ ප්‍රාර්ථනාවන් බෙහෙවින් විවිධ වන අතර, ප්‍රතිපත්ති සම්පාදකයන් සිය වැඩ කටයුතුවල සීමාවෙන් ඔබ්බට ගොස් ඒවා විමසා බැලීම අවශ්‍ය වේ. 2010 වසරේ දී තනතුර භාර ගත් විට මෙම තත්ත්වය වටහා ගත හැකි වූ බැවින්, එවක තරුණ පරපුර තුළ පැවති උසස් අපේක්ෂා සැපිරිය හැකි වන පරිදි පද්ධති, ප්‍රවිෂ්ටයන්, වැඩ සටහන් සහ ව්‍යාපෘති යළි හැඩ ගස්වන ලදි. තරුණ කටයුතු සහ නිපුණතා සංවර්ධන අමාත්‍ය ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමාගේ පූර්ණ ආශීර්වාදය ඇතිව ජාතික තරුණ සේවා සභාවට හඳුන්වා දෙන ලද "ශ්‍රී ලංකා තාරුණ්‍යය" නම් සංකල්පය, පොදුවේ තරුණ පරපුරේ ද තරුණ සංවර්ධන ක්ෂේත්‍රයේ නියැලි අන් සියලු පාර්ශ්වකරුවන්ගේ ද පූර්ණ පිළිගැනීමට ලක් විය.

අප ශ්‍රී ලංකා තරුණ පාර්ලිමේන්තුවට මුල පිරුවේ ශ්‍රී ලංකාව ජන වසන්තයක් අත්විඳි සමයක ය. මට නම්, අන් කිසි කලෙක නොවූ තරම් විශාල තරුණ ජනගහනයක් සිටීම සම්පතකි. ප්‍රජා මූල මට්ටමේ තරුණයන් වෙත ළඟා වීමේ යන්ත්‍රණය වන, මේ වන විට රටේ දස දෙස මිලියන 1.2කට ආසන්න තරුණ සාමාජිකත්වයක් සහිතව පෙරට යමින් සිටින ශ්‍රී ලංකා තරුණ සමාජ සම්මේලනය, අර්ථාන්විත තරුණ සහභාගිත්වය සහ තරුණයන් බල ගැන්වීම සහතික කිරීමට විශිෂ්ට කාර්ය භාරයක් ඉටු කර ඇත. රට තුළ පවත්නා පැරණිතම සහ විශාලතම තරුණ ආයතනය ද, සැබවින් ම මෙම කලාපය තුළ පවත්නා පැරණිතම සහ විශාලතම තරුණ ව්‍යාපාරය ලෙස ද සැලකෙන "ශ්‍රී ලංකා තාරුණ්‍යය" මෙම වත්මන් ප්‍රගතිය පිළිබඳව බෙහෙවින් ආඩම්බර විය යුතු ය.

ශ්‍රී ලංකාවෙහි පවත්නා වත්මන් තත්ත්වය සහ පසුබිම තුළ, එක් අතකින් ජාතික සංවර්ධනය තුළත් අනෙක් අතින් සිය පෞද්ගලික සංවර්ධනයෙහි ලාත් සක්‍රියව සම්බන්ධ වීමට තරුණයන්ට වැඩි වැඩියෙන් අවස්ථා නිර්මාණය වී සහ විවෘත වී ඇත. එහෙත් රටේ සමාජ-ආර්ථික සංවර්ධනයට දායක වීමට නම්, සිය පෞද්ගලික සහ වෘත්තීය සංවර්ධන ප්‍රමුඛතාවන්ට අමතරව ඔවුන් පාලනය පිළිබඳව ද දැනුවත්කම අත් කර ගත යුතු යැයි අපි දැඩිව විශ්වාස කරමු.

මෙම කරුණු සැලකිල්ලට ගන්නා විට, තරුණයන් පාලනය පිළිබඳව දරන අදහස් විශ්ලේෂණය කිරීම සඳහා ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනය යෝජනා කර තිබෙන මෙම ව්‍යායාමය ඉහළ පිළිගැනීමකට ලක් වනු නිසැක ය.

ලලිත් පියුම් පෙරේරා (නීතිවේදී),
ශ්‍රී ලංකාවේ තරුණ කටයුතු අධ්‍යක්ෂ ජනරාල් සහ
ජාතික තරුණ සේවා සභාවේ සභාපති



# විධායක සම්පිණ්ඩණය



යෞවනයන් යනු ජාතියක ජීවනාලියයි. ශ්‍රී ලංකාවේ මිලියන පහක යොවුන් ජනගහනයක් ඇත. එය රටේ ජනගහනයෙන් 26% ක ප්‍රතිශතයකි. ඔවුන්හට රැකියා අවස්ථා ලබාගැනීම ගැටලුවක්ව පවතින අතර සෑම වසරකම පිළිවෙලින් ශිෂ්‍යයින් 150,000 ක් සහ 130,000ක් අ.පො.ස. (සා.පෙ) සහ අ.පො.ස. (උ.පෙ) විභාගවලින් පසු පාසැල් පද්ධතියෙන් බැහැර වෙති. ඔවුන් බහුතරය උසස් අධ්‍යාපනය සඳහා යොමු නොවේ. මේ අනුව තරුණයින්ගෙන් 92% ක් අසම්පූර්ණ මූලික අධ්‍යාපනයක් පමණක් ලබාගෙන රැකියා සොයා යති. සියලුම තරුණයින්ට යහපත සලසන සාධාරණ ආර්ථික සංවර්ධනයක් ලබාගැනීමට නම් තරුණයින් එම ක්‍රියාවලියේ කොටස්කරුවන් විය යුතුය. යොවුන් සමාජයේ අනාගතය රඳාපවත්නා මෙම සංවර්ධන ඉලක්කයන් සපුරා ගැනීමට නම් ඔවුන් සුපිළිපන්භාවය සහ අවංකත්වය පෙරදැරිකර ගෙන දූෂණයට එරෙහිවීමේ දැඩි කැපවීමකින් කටයුතු කළ යුතුය.

මෙම හේතුව නිසාම ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය යෞවනයින්ගේ සුපිළිපන්භාවය සහ දූෂණයට එරෙහි වීමේ නැඹුරුව ප්‍රවර්ධනය කිරීමේ ප්‍රයත්නයක් දියත්කරන ලදී. ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය රට පුරාම සිටින යෞවනයින් සමග කටයුතු කරමින් තම ප්‍රජාවන්ගේ මෙන්ම ජාතික මට්ටමෙන්ද ඇති කළ යුතු වෙනස්කම්වල නියෝජිතයින් වීම සඳහා ඔවුන්ව බලගැන්වීට කටයුතු කරනු ඇත. මේ සඳහා ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය, ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ලේකම් කාර්යාලය සහ ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ෆීජි, ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ඉන්දුනීසියා, ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් දකුණු කොරියා යන ආයතන හා එක්ව කටයුතු කරයි.

මෙම ක්‍රියාවලියේ පළමු පියවර වූයේ තාරුණ්‍යයේ සුපිළිපන්භාවය පිළිබඳව සමීක්ෂණයක් Youth Integrity Survey (YIS) පැවැත්වීමය. මුහුණට මුහුණලා සිදුකළ සම්මුඛ සාකච්ඡා පදනම් කරගෙන සවිස්තරාත්මකව සිදුකළ මෙම සමීක්ෂණය මගින් සුපිළිපන්භාවය සහ දූෂණය පිළිබඳව තරුණයින්ගේ අවබෝධය, ආකල්ප සහ හැසිරීම් සම්බන්ධව මූලික තත්වය සනාථ කරනු ලැබීය. අරමුණු දෙකක් පදනම් කරගෙන සිදුකළ මෙම සමීක්ෂණය මගින් ශ්‍රී ලාංකික තරුණයින්ගේ සුපිළිපන්භාවයේ වත්මන් මට්ටම දැන ගන්නා අතරම දූෂණයට සහ ව්‍යාජත්වයට එරෙහිව ඔවුන්ගේ සහභාගීත්වයේ මට්ටමද සොයාගැනීම සිදුවිය.

ටුවර්ඩ්ස් ට්‍රාන්ස්පේරන්සි වියට්නාම් (Towards Transparency Vietnam) සහ ඔවුන්ගේ හවුල්කරුවන් විසින් මුලින්ම සකස්කරණ ලද සමීක්ෂණ ක්‍රියාවලිය මෙම තාරුණ්‍යයේ සුපිළිපන්භාවය පිළිබඳව සමීක්ෂණය සඳහාද ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය විසින් යොදාගන්නා ලදී. ශ්‍රී ලංකාවේ සංස්කෘතික සහ සමාජයීය යථාර්ථයන් පිළිබිඹු වන අයුරින් සමීක්ෂණය වැඩිදියුණු කරන ලද අතර ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ආයතනය මෙම සමීක්ෂණය සිදුකළ අනෙකුත් රටවල් සමග සමීප සංසන්දනයන් සිදුකිරීමට හැකිවන පරිදි කේන්ද්‍රීය ප්‍රශ්න සහ මූලධර්ම එලෙසම පවත්වාගන්නා ලදී.

තරුණ තරුණියන් 1000කට වැඩි සංඛ්‍යාවක් මුහුණට මුහුණලා සිදුකළ මෙම සමීක්ෂණයට සහභාගී වූ අතර ඊට අමතරව පාලක කණ්ඩායමක් ලෙසට 1000ක වැඩිහිටියන්ද එක්වූහ. සහභාගීවූ සෑම අයෙක්ම ඔවුන්ගේ ස්ත්‍රී පුරුෂ භාවය, ග්‍රාමීය සහ නාගරික පදිංචිය, අධ්‍යාපනය සහ අනෙකුත් සමාජ දත්තයන් අනුව වෙන්කරන ලදී. සහභාගීවූ සියලුම වැඩිහිටියන් සහ තරුණයින් ශ්‍රී ලංකාවේ පළාත් නවයෙන් (9) අහඹුලෙස තෝරා ගන්නා ලද අතර නාගරික සහ ග්‍රාමීය ජනගහනය සමානුපාතිකව නියෝජනය විය.

# A. අනාවරණය කරගත් ප්‍රධාන කරුණු

## A.1 සුපිළිපන්භාවය කෙරෙහි ඇති වටිනාකම් සහ ආකල්ප

තාරුණ්‍යයේ සුපිළිපන්භාවය පිළිබඳව සමීක්ෂණයේ පළමු අරමුණ වූයේ සුපිළිපන්භාවය පිළිබඳව තරුණ අදහස් ගවේෂණය කිරීම හා එහි ස්වායත්ත සහ පරායත්ත වටිනාකම් සහ ඒවා තමන් සඳහා සහ අන්‍යයන් සඳහා ප්‍රත්‍යක්ෂකර ගන්නා ආකාරය සොයා බැලීමය. ඒ අනුව තරුණයින්ට පොදුවේ තමන්ගේ ආකල්පයන්ද, විශේෂයෙන් අනුන් පිළිබඳව සහ පවතින ජීවන තත්ත්වයන්ට අනුව සුපිළිපන්භාවය පිළිබඳව වටහාගත හැකි ප්‍රශ්න මාලාවක් යොදගන්නා ලදී.

ශ්‍රී ලාංකික තරුණයින් සුපිළිපන්භාවය පිළිබඳව න්‍යායාත්මකව සැළකියයුතු අවබෝධයක් ලබා ඇති බව තාරුණ්‍යයේ සුපිළිපන්භාවය පිළිබඳව සමීක්ෂණයේදී හෙළිවිය. කෙසේ වෙතත් ශ්‍රී ලංකාවේ ප්‍රායෝගික ජීවන යථාර්ථයන් හමුවේ සුපිළිපන්භාවය යනුවෙන් අදහස්කරන තත්ත්වයන් සහ දෛනික ජීවිතයේදී සුපිළිපන්භාවය ප්‍රකාශ කරන ආකාරය පිළිබඳව ඇති අවබෝධය බොහෝවිට නම්‍යශීලී විය.

සුපිළිපන්භාවය තම ජීවිතවලට වැදගත්බව සහභාගීවූ තරුණයින් ගෙන් 88% ක් ප්‍රකාශ කළ අතර මෙම කැපවීම ප්‍රායෝගික තලයේදී එතරම් ප්‍රබල නොවීය. සුපිළිපන්භාවයෙන් යුතු පුද්ගලයෙකු තම පවුලේ සාමුහිකත්වය රැක ගනු සඳහා නීතිය කඩකිරීම බහුතරයක් විසින් අනුමත කරන ලදී. සුපිළිපන් පුද්ගලයෙකු අතින් සමහරවිට නීතිය කඩවිය හැකි බව සහභාගීවූවන්ගෙන් 20% ක් ප්‍රකාශ කරන ලද අතර සහභාගීවූවන්ගෙන් 24%ක් ප්‍රකාශ කළේ සුපිළිපන්භාවය සුදුසු වන්නේ සමහර අවස්ථාවලදී පමණක් බවය. මුල්‍යමය සාර්ථකත්වය හා සම්බන්ධ කරුණු වලදීද එසේම විය. මීට අමතරව අවංකවීම සහ නීතිගරුක වීම ජීවිතයට යම් ප්‍රමාණයකට පමණක් වැදගත්වන බව 30% කගේ අදහස විය.




රූප සටහන A.1 සාර්ථකත්වය සඳහා සුපිළිපන්භාවය -ස්ත්‍රීපුරුෂභාවය අනුව

මුල්‍යමය සාර්ථකත්වය සඳහා වංචනික බව වඩාත් සුදුසු මාර්ගයන් වන බව ශ්‍රී ලාංකික තරුණයින් ගෙන් කොටසක් (30%) විසින් විශ්වාස කිරීම මගින් දූෂණයට පෙළඹීම සඳහා ඇති නැඹුරුතාව පිළිබිඹුවේ. මෙය මුල්‍යමය සාර්ථකත්වය සමග තදින් බැඳී පවතී. සාපේක්ෂ වශයෙන් ඉහල ජීවන වියදම් මට්ටමක් සහ ගැටුම්කාරී අස්ථාවර ඉතිහාසයක් සහිත රටක් සඳහා එසේ වීම විමතියට කරුණක් නොවේ.

## A.2 අත්දැකීම් සහ චර්යාවන්

පසුගිය වසර තුළ දූෂණ ක්‍රියාවක නියැලී ඇත්තේ සමීක්ෂණයට සහභාගීවූ තරුණයින් ගෙන් 25%කට අඩු සංඛ්‍යාවකි. මෙලෙස ඇත්තෙන්ම දූෂණ ක්‍රියාවක යෙදී ඇත්තේ සාපේක්ෂව අඩු සංඛ්‍යාවක් වන නමුත් සැළකිය යුතු තරුණයින් සංඛ්‍යාවක් කිසියම් දූෂිත ක්‍රියාවක නියැලීමට කැමැත්ත පළ කර ඇත.

අධ්‍යාපනය සම්බන්ධයෙන් ශිෂ්‍යයින් ගෙන් 70%ක් කිසිම දූෂිත ක්‍රියාවක නියැලී නොමැති නමුත් අයහපත් තත්ත්වය වන්නේ 80%කටත් වැඩි බහුතරය රැකියා අවස්ථාවක් සඳහා හෝ කිසියම් වැදගත් ලියවිල්ලක් ලබා ගැනීම සඳහා දූෂිත ක්‍රියාවක නියැලීමට කැමැත්ත පළකිරීමය. මෙම තත්ත්වය තරුණියන්ට වඩා තරුණයින් අතරද නාගරිකයින්ට වඩා ග්‍රාමීය තරුණයින් අතරද වැඩි බව පෙනීගොස් ඇත. මෙය පුද්ගලික වටිනාකම් පිළිබිඹු කරන සිදුවීමක් මෙන්ම මොවුන් ආචාරශීලී නොවන අවශ්‍යතාවයන්ට හෝ අභියෝග යන්ට මුහුණදෙන බව පිළිබිඹු කරන්නක්ද විය හැකිය.

නාගරික තරුණයින් ගෙන් 40%ක්ද ග්‍රාමීය තරුණයින් ගෙන් 23%ක්ද තම ඥාතියෙකු ගේ අවශ්‍යතාවයකට හෝ පවතින සාමාන්‍ය තත්ත්වය නිසා ආචාරශීලී නොවන හැසිරීමක යෙදීමට පසුබට නොවන බව පවසා ඇත. මෙයින් පෙන්වන්නේ ඥාතිසංග්‍රය සහ අවිධිමත් උපකාරයන් කිරීමේ සංස්කෘතිය ශ්‍රී ලංකාව තුළ කැපීපෙනෙන ලක්ෂණයක් වන බවය. සුපිළිපන්භාවය පිළිබඳ ප්‍රබල වටිනාකම් සහිත තරුණයින්ට පවා මෙම සාමාජීය සහ පවුලේ පීඩනයන් හමුවේ ආචාරශීලී නොවන හැසිරීම්වලට  අනුගතනොවී සිටීමට නොහැකිවනු ඇත.

දූෂණය පිළිබඳව අත්දැකීම් සඳහා තරුණයන් ආභාෂය ලබන්නේ සුපිළිපන්භාවය සහ දූෂණය ඔවුන් දකින ආකාරය අනුවය. එමනිසා රාජ්‍ය ආයතන සම්බන්ධයෙන් ඔවුන්ගේ විශ්වාසය පිළිබඳ ප්‍රශ්නය විශේෂයෙන් විමර්ශනය කිරීමට ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය (TISL) තීරණය කරන ලදී. අපේක්ෂාකළ පරිදිම, රාජ්‍ය නිලධාරීන් පිළිබඳව විශේෂයෙන්ම පොලිසිය සහ ප්‍රාදේශීය පරිපාලනය කෙරෙහි, තරුණයින් දක්වන ලද්දේ ඉතා පහත් හැඟීමකි. මෙම රාජ්‍ය ආයතනවල පවතින මුල් බැසගත් ඉහල දූෂිත තත්ත්වයන් ශ්‍රී ලාංකික තරුණයින්ගේ සුපිළිපන්භාවය පිළිබඳ ශක්තිය සීමාකරන තවත් සාධකයක් වූවා විය හැකිය.

## A.3 තරුණ සුපිළිපන්භාවයට ඇති වන බලපෑම් සහ ගත හැකි ක්‍රියාමාර්ග

TISL ආයතනයට තරුණයන් තම අදහස්/ මතවාද ගොඩනගාගන්නා අන්දම පිළිබඳව අවබෝධයක් ලබාගත හැකිනම් ඒ අනුව ඔවුන්ගේ මතයන් සුබවාදීව සහ ධනාත්මකව සකස් කිරීමට හැකියාව ලැබේ. මේ අනුව, ශ්‍රී ලාංකික තරුණයින් තොරතුරු ලබාගන්නා ආකාරයත් සමාජයේ පවතින සුපිළිපන්භාවය සහ දූෂණය පිළිබඳව ඔවුන් කෙතරම් දැනුම්වත්දැයි තහවුරුකර ගැනීමත් YIS සමීක්ෂණයේ ප්‍රබල අපේක්ෂාවක් විය.

සමීක්ෂණයට අනුව ශ්‍රී ලාංකික තරුණයින් මාධ්‍ය ගණනාවකින් තොරතුරු ලබාගනී. ඒවා අතර රූපවාහිනිය (31%), ගුවන්විදුලිය (20%) සහ ජංගම දුරකථනය (18%) ඇතුළත්ය. කෙසේ වෙතත් රටේ බොහෝ ප්‍රදේශවලට අන්තර්ජාල පහසුකම් නොමැතිවීම නිසා  සමාජ මාධ්‍යය හෝ අන්තර්ජාලය මගින් වැදගත් තොරතුරු ලබාගත හැක්කේ අපේක්ෂිත සංඛ්‍යාවට වඩා අඩු සංඛ්‍යාවකටය. (පිළිවෙලින් 5% ක් සහ 4%ක්).

අවාසනාවකට මෙන් ශ්‍රී ලාංකික තරුණයන්ට දූෂණය පිළිබඳව රටේ පවතින නීති රාමුව පිළිබඳව තොරතුරු ලබාදීමට මෙම මාධ්‍යයන්ට ඇත්තේ අල්ප හැකියාවකි. සමීක්ෂණයට සහභාගීවූවන්ගෙන් 6% ක් පමණක් හොඳින්ම දූෂණය පිළිබඳ දැනුවත් යයි සිතා සිටි අතර 55%ක් කිසිවක් නොදත් හෝ ඉතා අල්ප වශයෙන් දත් කණ්ඩායමට අයත් විය. එමෙන්ම, මෙම කරුණ සම්බන්ධයෙන් අධ්‍යාපන පද්ධතිය තරුණයින්ට නිසි මගපෙන්වීම ලබා දී නොමැත. ප්‍රාථමික, ද්විතීය හෝ තෘතීය අධ්‍යාපන මට්ටම් අතර දූෂණය සම්බන්ධයෙන් පවතින නීති හා රෙගුලාසි පිළිබඳව ඇති දැනුම්වත් බවේ වෙනසක් දක්නට නොලැබුනි.




රූප සටහන A3.1 දූෂණය පිළිබඳව තොරතුරු ලබාගැනීමේ හැකියාව තරුණ සහ වැඩිහිටි ප්‍රතිශතයන්

අවසානයේදී තමන් දූෂණයට එරෙහිව හඬනැගීමට කැමතිදැයි සමීක්ෂණය හරහා තරුණයන් ගෙන් විමසන ලදී. තරුණයින් 73%ක් අඩුම තරමින් සමහර අවස්ථාවලදී හෝ දූෂණයට එරෙහිව හඬනැගීමට සූදානම් බව පැවසීම බලාපොරොත්තු සහගත තත්වයකි. එනමුත් සැබවින්ම එසේ සිදුකර ඇත්තේ තරුණයින් ගෙන් 7%ක් පමණක් වන අතර අනෙක් අයට එසේ නොකර සිටීමට විවිධ හේතු තිබුනි. එමනිසා වෙනසක් සිදුකිරීමට කැමැත්තක් දක්වන මෙම තරුණයින්ට සැබවින්ම දූෂණයට එරෙහිවීමට හැකියාව ලැබෙන පරිදි ඔවුන් බලගැන්වීම අනිවාර්යයෙන් සිදුකළ යුතුය.

## B. නිගමන සහ නිර්දේශ

සුපිළිපන්භාවයට පත්වීමේ සහ දූෂණයට එරෙහිවීමේ සැබෑ වටිනාකම ශ්‍රී ලාංකික තරුණයෝ දකිති. එසේවුවත් තොරතුරු හිඟකම, දූෂිත නිලධාරීන්ගෙන් ඇතිවන සංස්කෘතික සහ සමාජමය පීඩනය, පවුල් සබඳතා සහ දෛනික ජීවන රටාව මගින් මොවුන්ගේ කැපවීම දුර්වලකර ඇත.

සමීක්ෂණයට සහභාගීවූ පිරිමි සහ ගැහැනු පාර්ශවයන් අතර ප්‍රබල බෙදීමක් දක්නට ලැබුනු අතර ගැහැනු පාර්ශවය තුළ සුපිළිපන්භාවයට දැඩි කැපවීමක් වචනයෙන් මෙන්ම ක්‍රියාවෙන්ද දක්නට ලැබුනි. එමෙන්ම නාගරික තරුණයින් තම ග්‍රාමීය සගයන්ට වඩා සුපිළිපන්භාවය අගයකරනු ලැබීය. කෙසේනමුත් මෙම තත්වයන්ට හේතුවී ඇත්තේ මෙම කණ්ඩායම් ලබන අත්දැකීම් සහ මුහුණදෙන පීඩනයන් විනා ඔවුන්තුළ ඇති සදාචාරාත්මක හෝ සංස්කෘතික වෙනස්කම් නොවේ.

අඩුතරමින් ඇතැම් අවස්ථාවලදී හෝ දූෂණයට එරෙහිව හඬනැගීමට ශ්‍රී ලාංකික තරුණයින් ගෙන් බහුතරයක් කැමැත්තෙන් සිටී. මෙම කැමැත්ත බිය හා තමා අසරණයැයි ඇති වන හැඟීම නිසා යටපත්වී තිබුනද ඒවා ජයගත හැකි අභියෝගයන්ය. සුපිළිපන්නව ජීවිත ගතකිරීමට ඇති අපේක්ෂාවන් සපුරාගැනීමට සහායවීමට සහ ඒ සඳහා තරුණයින් බලගැන්වීමට ප්‍රබල පියවර ගැනීමට හැකිනම් ශ්‍රී ලාංකික තරුණයින්ගේ අනාගතය දීප්තිමත් වන බවට නිගමනය කළ හැකිය.

මෙම අරමුණ පෙරටුකරගෙන සහ තාරුණ්‍යයේ සුපිළිපන්භාවය පිළිබඳව සමීක්ෂණය පදනම් කරගෙන TISL ආයතනය පහත සඳහන් නිර්දේශයන් ඉදිරිපත් කරයි.

- තාරුණ්‍යයේ සුපිළිපන්භාවය පිළිබඳව සමීක්ෂණය මගින් මතුවූ ගැටලු වලට පිළිතුරු සපයාගනු සඳහා දූෂණය සහ සුපිළිපන්භාවය පිළිබඳව අතිරේක සමීක්ෂණයන් සම්පූර්ණ කිරීම.

- ගුරුවරුන්, අදාළ අමාත්‍යවරුන් සහ රාජ්‍ය නිලධාරීන් සමග එක්ව දූෂණයට එරෙහි උපදේශයන්ගේ ප්‍රමිතිය නැංවීමටත් අධ්‍යාපන මෙවලම් වෙත සමීපවීමට ඇති හැකියාව වැඩි කිරීමටත් කටයුතු කිරීම.

- TISL සුපිළිපන් තාරුණ්‍ය පිළිබඳ වැඩසටහන මගින් පසු-පාසැල් අධ්‍යාපනික වැඩසටහන් හරහා දූෂණයට එරෙහිව සටන් කිරීම සඳහා සැබෑ නායකයින් බවට පත්වීමට තරුණයින්ට අවස්ථාව ලබාදීම.

- දූෂණයට එරෙහිව සටන් කිරීමට තරුණයින්ට ඇති අවස්ථා වැඩිකිරීමට ඔවුන් හා සහයෝගයෙන් කටයුතු කිරීම සහ ඔවුන් එසේ කරන විට නවෝත්පාදක සමාජ ජාලයන් භාවිතාකරමින් සහ දූෂණයට එරෙහි ප්‍රමුඛතා දුරකථන අංකයක් හඳුන්වා දෙමින් ඔවුන්ට සහාය වීම.

- සුපිළිපන්භාවයට පත්වීමේදී ශ්‍රී ලාංකික තරුණයින් විසින් මුහුණදෙන අභියෝග හුවාදක්වමින් සුපිළිපන්භාවයේ අර්ථවත් වටිනාකම් ප්‍රවර්ධනය කිරීම සඳහා විධිමත් මාධ්‍ය ව්‍යාපාරයක් දියත්කිරීම.

- ප්‍රසිද්ධ ඇගයීම් සහ ප්‍රදානයන් මගින් ආදර්ශවත් භූමිකාවන් සිදුකරන තරුණයින් ඇගයීම, ඔවුන්ගේ කටයුතු ප්‍රවර්ධනය කිරීම සහ තරුණ නායකයින් සඳහා උපදේශන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.

- පොලීසිය සහ රාජ්‍ය නිලධාරීන් අතර දූෂිත ගනුදෙනු ප්‍රතික්ෂේප කිරීමටත් දූෂිත ඉල්ලීම් අවම කිරීමටත් තරුණයින් හා එක්ව නව ක්‍රමවේදයන් සකස් කිරීමට කටයුතු කිරීම.


Youth for Integrity

# හඳුන්වාදීම

තාරුණ්‍යයේ සුපිළිපන්භාවය පිළිබඳව සමීක්ෂණයේ අරමුණු වන්නේ:

- ශ්‍රී ලාංකික තරුණ තරුණියන්ගේ සුපිළිපන්භාවය පිළිබඳව මූලික පසුබිම හඳුනාගැනීම.
- තරුණයන් දූෂණයට එරෙහිව හා සුපිළිපන්බව අභියෝගයට ලක්වීමට එරෙහිව ක්‍රියාත්මකවන මට්ටම නිර්ණය කර ගැනීම.

වර්තමානය වන විට දිගු කාලීන යුද්ධයක ප්‍රතිඵල වලින් සුවය ලබමින් සිටින රටක් වන ශ්‍රී ලංකාව වර්ගවාදී ගැටලුවට විසඳුම් සොයන අතර රටතුල ශක්තිමත් ප්‍රජාතන්ත්‍රවාදී පාලන ව්‍යුහයක් ප්‍රතිෂ්ඨාපනය කරගැනීමේත් ගෝලීය වශයෙන් පිළිගත් මානව හිමිකම් සුරැකීමේත් අභියෝගාත්මක කාර්යය අභිමුව සිටින ඒ පිළිබඳ උනන්දුවෙන් පසුවන රටකි[1]. එම අරමුණු ඉටුකර ගැනීමට හැකි සෑබෑ පදනම පරිපූර්ණ සමාජයක් ගොඩනැගීම බව ඒ සඳහා කැපවී සිටින ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ (TISL) විශ්වාසයයි.

සුපිළිපන් සමාජයක් ගොඩනැගීම සඳහා ශ්‍රී ලාංකික තරුණයින් අතර සුපිළිපන්භාවය පිළිබඳව සවිමත් වටිනාකම් සහ පුද්ගල කැපවීම සංවර්ධනය කිරීම අවශ්‍යය. මෙම සමීක්ෂණය එලෙස වටිනාකම් සහ කැපවීම් ගොඩනැගීමේ පුළුල් ක්‍රියාවලියක පළමු පියවර ලෙස හැඳින්විය හැකිය. මෙම අරමුණ සාක්ෂාත් කරගැනීම සඳහා TISL ආයතනය, ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ආයතනයේ මහලේකම් කාර්යාලය සහ ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ෆීජි, ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ඉන්දුනීසියා, ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල්, දකුණු කොරියා යන ආයතන හා ඒකාබද්ධව කටයුතු කරයි.

තාරුණ්‍යයේ සුපිළිපන්භාවය පිළිබඳව සමීක්ෂණය අවධානය කරනු ලැබුවේ ශ්‍රී ලංකාවේ තරුණයින් විසින් සුපිළිපන්භාවය යන සංකල්පය වටහාගෙන ඇති ආකාරයත් දූෂණය හා සම්බන්ධ අවස්ථාවන් පිළිබඳ ඔවුන්ගේ දැනුම්වත් බව සහ අවබෝධය, දූෂණයට මුහුණදුන් විට ඔවුන්ගේ ආකල්ප, හැසිරීම, ක්‍රියාවන්, මෙන්ම තරුණයින්ගේ වටිනාකම් සහ හැසිරීම් වර්ධනය සඳහා බලපාන සාධක කවරේද යන්න පිළිබඳවත්ය.

මෙම සමීක්ෂණය සඳහා සුපිළිපන්භාවය අර්ථ දක්වා ඇත්තේ පුද්ගලයින් මෙන්ම ආයතන විසින් පිළිගත යුතු, දූෂණයට එරෙහිව බාධක නිර්මාණය කරන, සදාචාරයට සහ ආචාරධර්මවලට අනුකූල ප්‍රතිපත්තීන් සහ ප්‍රමිතීන් සමුදයක් ලෙසය. මෙම අර්ථ දැක්වීම ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ආයතනය විසින් 2009 වසරේ නිකුත්කළ මාර්ගෝපදේශක අත්පොතෙහි සඳහන් කර ඇත. සමීක්ෂණයේදී තරුණයින් ලෙස සලකා ඇත්තේ වසර 15 සිට 30 දක්වා වයස් සීමාවේ පසුවන්නන්ය.

# ක්‍රමවේදය

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය විසින් සිදු කරන ලද තාරුණ්‍යයේ සුපිළිපන්භාවය පිළිබඳ සමීක්ෂණය සඳහා පදනම් වූයේ ටුවර්ඩ්ස් ට්‍රාන්ස්පේරන්සි වියට්නාම් (Towards Transparency Vietnam) විසින් 2011දී සාර්ථකව නිමකරන ලද තාරුණ්‍යයේ සුපිළිපන්භාවය පිළිබඳ සමීක්ෂණයයි. සමීක්ෂණය ක්‍රියාත්මක කිරීම සැලසුම් කිරීම සඳහා, ටුවර්ඩ්ස් ට්‍රාන්ස්පේරන්සි වියට්නාම්, ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ලේකම් කාර්යාලය සහ ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ෆීජි, ට්‍රාන්සපේරන්සි ඉන්ටනැෂනල් ඉන්දුනීසියා, ට්‍රාන්සපේරන්සි ඉන්ටනැෂනල් දකුණු කොරියා යන ආයතනවල නියෝජිතයින් 2012 අප්‍රියෙල් මාසයේදී ශ්‍රී ලංකාවේ මීගමුවේදී හමුවන ලදී. වියට්නාමයේ සහ ලේකම් කාර්යාලයේ නියෝජිතයින්ගේ විශේෂඥ දැනුම උපයෝගී කරගෙන සමීක්ෂණය සඳහා පරාමිතීන් සාකච්ඡා කරන ලද අතර ඒවා දේශීය තත්ත්වයන්ට අනුගත කරන උපාය මාර්ගයන් හඳුනාගන්නා ලදී. තාරුණ්‍යයේ සුපිළිපන්භාවය පිළිබඳ සමීක්ෂණ ක්‍රියාත්මක කරන ලද විවිධ රටවල් අතර සමහර වෙනස්කම් තිබිය හැකි නමුත් අප තරුණ සුපිළිපන්භාවය නංවාලීමට සහ දූෂණය පිටුදැකීමට එක්ව කටයුතු කරන නිසා සහයෝගීතාවයට සහ සංසන්දනයට හැකියාව ලැබුණි.

ජාත්‍යන්තර සංඛ්‍යාන ප්‍රමිතීන්ට අනුකූලව තාරුණ්‍යයේ සුපිළිපන්භාවය පිළිබඳව සමීක්ෂණය සඳහා ශ්‍රී ලංකාවේ පළාත් නවයම නියෝජනය වන පරිදි බහුවිධ නියැදි ක්‍රමයක් භාවිතාකරන ලදී. ශ්‍රී ලංකාවේ ජනගහන ඝනත්වය සහ වාර්ගික සංඛ්‍යාන පිළිබඳ විශ්ලේෂණයකින් පසුව එක් එක් පළාතකින් වැඩිම ජනගහනයක් සහ වාර්ගික විවිධත්වයක් ඇති දිස්ත්‍රික්ක අටක් නියැදිය සඳහා තෝරාගන්නා ලදී. බස්නාහිර පළාතේදී අග නගරය වන කොළඹ නගරය මෙන්ම රටේ සමස්ත ජනගහනයෙන් 1/5 ක් සිටින බස්නාහිර පළාතේ වැඩිම ජනගහනයක් සිටින දිස්ත්‍රික්ක දෙක සමීක්ෂණය සඳහා තෝරාගන්නා ලදී.

මේ අනුව එක් එක් දිස්ත්‍රික්කයකින් නාගරික ප්‍රදේශ 11ක් ද ග්‍රාමීය ප්‍රදේශ 11ක් ද (ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ) තෝරාගන්නා ලදී. මෙසේ තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල උතුරු, නැගෙනහිර, දකුණ, බස්නාහිර සහ මධ්‍යම කොටස් නියෝජනය වන පරිදි නාගරික නියැදි ඒකක 10ක්ද ග්‍රාමීය නියැදි ඒකක 10 ක්ද බැගින් (ග්‍රාම නිලධාරි කොට්ඨාශ) අහඹු ලෙස තෝරාගන්නා ලදී. අනතුරුව, තෝරාගත් ග්‍රාම නිලධාරි කොට්ඨාශ සඳහා ශ්‍රී ලංකා ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් සකස් කර ඇති ගෘහ මූලික ලැයිස්තු භාවිතාකොට සමීක්ෂණය සඳහා සහභාගීකර ගන්නා ඉලක්ක කණ්ඩායම (තරුණ) සහ පාලක කණ්ඩායම (වැඩිහිටි) තෝරාගන්නා ලදී[2]. අවසානයේදී ජාතික තරුණ සේවා සභාවේ සාමාජිකයින් සැදුම්ලත් සමීක්ෂණ කණ්ඩායමක් විසින් තරුණයින් 1004 දෙනෙකු සහ වැඩිහිටියන් 1012 ක් සහභාගී වූ මුහුණට මුහුණ ලා කෙරෙන සම්මුඛ පරීක්ෂණ සිදුකරන ලදී.

## A. ප්‍රශ්නාවලිය සැලසුම් කිරීම

තාරුණ්‍යයේ සුපිළිපන්භාවය පිළිබඳව සමීක්ෂණයේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ සඳහා වූ ප්‍රශ්නාවලිය ව්‍යාපෘතිය සඳහා එක්වූ රටවල් හතරම පුළුල්ව තහවුරු කරන ලදී. පහත සඳහන් විෂයයන් ආවරණය වන පරිදි මෙම ප්‍රශ්නාවලිය මනාව ක්‍රමාංකිත කරන ලදී:

- සදාචාරය සහ ආචාර ධර්ම - හැසිරීම පිළිබඳ සම්මතයන් ගැන සංකල්පික අවබෝධය.
- ප්‍රතිපත්ති - කුමක්ද වැරදි කුමක්ද නිවැරදි වෙන්කර හඳුනාගැනීම.
- නීතිගරුක බව - සමාජය විසින් පනවා ඇති නීතිමය රාමුවට අනුගතවන ප්‍රමාණය.
- දූෂණයට දක්වන ප්‍රතිරෝධය - දූෂිත ක්‍රියාවන්ට එරෙහිව අභියෝග කිරීමේ හැකියාව.

ක්‍රමවේදය

සමීක්ෂණයට සහභාගීවූවන් සමග මුහුණට මුහුණ ලා සිදුකළ සම්මුඛ පරීක්ෂණ වලින් ලබාගත් දත්තයන් අනුව තරුණයින් ගේ සුපිළිපන්භාවය පිළිබඳ පරාමිතීන් තුනක් හඳුනාගත් අතර ඒවා මෙම වාර්තාවේ දීර්ඝ වශයෙන් විශ්ලේෂණය කර ඇත:

## A.1 සුපිළිපන්භාවය කෙරෙහි තාරුණ්‍යයේ වටිනාකම් සහ ආකල්ප

තරුණයින් දූෂණය වටහාගෙන ඇති ආකාරය මැනබැලීම මෙම අධ්‍යයන පරාමිතිය මගින් උත්සාහ කරන ලදී. සුපිළිපන්භාවය ආරක්ෂාකර ගැනීම, මුදල් ඉපයීම සහ නීතිගරුක වීම පිළිබඳව සාපේක්ෂ වැදගත්කම සංසන්දනය කිරීම පිණිස විශේෂිත ප්‍රශ්න සහභාගීවූවන් ගෙන් අසන ලදී. අන් අයගේ සුපිළිපන්භාවය කෙරෙහි තමන් දක්වන සැලකිල්ල සහ ඔවුන් තුළ ඇති විශ්වීය අවබෝධය අනුව සුපිළිපන්භාවය සඳහා සාපේක්ෂ වටිනාකමක් ලබාදීම පිළිබඳවද සහභාගීවූවන් ගෙන් විමසන ලදී.

## A.2 තරුණ අත්දැකීම් සහ හැසිරීම්

සහභාගීවූවන්ට දූෂණය පිළිබඳව ඇති සත්‍ය අත්දැකීම් සහ ඒවාට ඔවුන් දැක්වූ ප්‍රතිචාර පිළිබඳව මෙම අධ්‍යයනය මගින් සොයා බලන ලදී. ඔවුන් අඩු වැඩි වශයෙන් දූෂණය ඉවසා සිටි විශේෂ අවස්ථාවන් පිළිබඳව හඳුනාගැනීමද මෙම ප්‍රශ්න වලින් අපේක්ෂා කරන ලදී. රාජ්‍ය අංශයේ දූෂණය ශ්‍රී ලංකාවේ සැළකිල්ලට භාජනය විය යුතු කරුණක් ලෙස නිතර දක්වා ඇත. එම නිසා මෙම පරාමිතිය තුළ විවිධ රාජ්‍ය සේවා සපයන්නන් අතර පවතින දූෂණ තත්ත්වයන් පිළිබඳව තම අවබෝධය දක්වන ලෙස සහභාගීවූවන් ගෙන් ඉල්ලා සිටින ලදී.

## A.3 පරිසර බලපෑම් සහ ක්‍රියාමාර්ග

තරුණයින් දූෂණය පිළිබඳව දැනගත්තේ කොතැනකින්ද සහ ඔව්හු ශ්‍රී ලංකාවේ දූෂණයට එරෙහි නීති සහ රෙගුලාසි පිළිබඳව කෙතරම් දුරට දැනුම්වත්දැයි දැනගැනීමට මෙම අධ්‍යයනය යොදාගන්නා ලදී. මීට අමතරව සුපිළිපන්භාවය ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් ඔවුන් දකිනා ක්‍රියාමාර්ග සහ තම සමාජය තුළ දූෂණය සිදුවීමට බලපාන බාහිර සාධක පිළිබඳවද සහභාගීවූවන් ගෙන් අසන ලදී. මෙම පරාමිතියෙහි අරමුණ වූයේ ශ්‍රී ලංකාවේ වෙනසක් සිදුකිරීමට තරුණයින්ගේ ඇති සූදානම සහ එසේ කිරීමට ඔවුනට ඇති බාධා හඳුනාගැනීමය.

මෙම සමීක්ෂණයට සහභාගී වූ අනෙකුත් රටවල භාවිතා කළ ප්‍රශ්න මෙහිදීද බොහෝවිට භාවිතාකරන ලදී. එසේ වුවද ශ්‍රී ලංකාවේ තරුණ සුපිළිපන්භාවය හඳුනාගැනීමට අර්ථවත් දයකත්වයක් සමීක්ෂණය මගින් ලබාගැනීම තහවුරු කර ගැනීම සඳහා සහභාගීවූවන් ගේ සමාජ හා ජන විකාශන ගතිලක්ෂණ භාවිතයෙන් අතිරේක දත්තයන්ද ලබාගන්නා ලදී. විශේෂයෙන් ස්ත්‍රී පුරුෂ සහ නාගරික ග්‍රාමීය යන ශ්‍රී ලාංකික සමාජයේ පවතින වැදගත් වෙනස්කම් දෙක පිළිබඳවද මෙම සමීක්ෂණය මගින් පෙන්වාදෙන ලදී. ශ්‍රී ලංකාවේ නාගරික හා ග්‍රාමීය ජන සමාජයන් අතර තියුණු බෙදීමක් තිබෙන අතර එමනිසා මෙම දත්තයන් වෙන්කිරීම වැදගත්විය[3]. ස්ත්‍රීපුරුෂභාවය සහ නාගරික ග්‍රාමීය භේදයන් නිසා සහභාගීවූවන් අතර ප්‍රතිවිරුද්ධතාවයන් අපේක්ෂා කරන ලදී. මෙම ප්‍රතිවිරුද්ධතාවයන් දීර්ඝවශයෙන් ඉදිරියේදී සාකච්ඡා කර ඇත.

## B. ක්ෂේත්‍ර කටයුතු

TISL කාර්ය මණ්ඩලය, ජාතික තරුණසේවා සභාවට අනුයුක්ත තරුණ ස්වේච්ඡා කණ්ඩායම් සමග ඒකාබද්ධව ක්ෂේත්‍ර කටයුතු සිදුකරන ලදී. ක්ෂේත්‍ර සමීක්ෂකයින් සහ අධීක්ෂකයින් ශ්‍රී ලංකා ජාතික තරුණසේවා සභාවට අනුයුක්ත තරුණ සමාජ නායකයින් අතුරින් පත්කරගන්නා ලදී. සමස්ථයක් වශයෙන් පළාත් නවයෙන් සමීක්ෂණයට සහභාගීවූවන් 2000 කට අධික විය.




රූපසටහන: B.1 ශ්‍රී ලංකාවේ සියලුම පළාත් ආවරණය වන පරිදි දිස්ත්‍රික් 10කින් අහඹුලෙස තෝරාගන්නා ලද තරුණයින් 1004ක් සහ වැඩැහිටියන් 1012ක්




රූපසටහන: B.2 : ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික් සිතියම - සමීක්ෂණය පැවැත්වූ දිස්ත්‍රික්ක

**සුපිළිපන්භාවය** නොමැතිවීම අනෙකුත් කරුණු වලට වඩා තම ජීවිතවලට බරපතල ගැටළුවක් බව සමීක්ෂණයට සහභාගීවූ තරුණයින් බහුතරයක් විශ්වාස කරයි. එමනිසා ශ්‍රී ලාංකික තරුණයින් තම පුද්ගලික ජීවිත වලටත්, තම පවුල් වලටත්, ආර්ථික දියුණුවට මෙන්ම පොදුවේ රටටත් සුපිළිපන්භාවය වැදගත්වන බව වටහාගෙන ඇති බවට නිගමනය කළ හැකිය.



# ප්‍රධාන අනාවරණයන්

## A. සුපිළිපන්භාවය පිළිබඳ තරුණ වටිනාකම් සහ ආකල්ප

ශ්‍රී ලංකාවේ පුද්ගල සුපිළිපන්භාවය සහ දූෂණය සම්බන්ධයෙන් වන තරුණයන්ගේ සාමාන්‍ය දැක්ම, වටිනාකම් සහ ආකල්ප පිළිබඳව විශ්ලේෂණය කිරීම මෙම අධ්‍යයනයේ මූලික පදනම විය. මෙම කරුණු පිළිබඳව තරුණයන් විසින් දරණ ප්‍රමුඛ අදහස් හඳුනාගැනීම මගින් ශ්‍රී ලාංකික තරුණ සංස්කෘතිය පිළිබඳව සහ අර්ථාන්විත සමාජ වෙනසකට ඔවුන්ගේ ඇති හැකියාව පිළිබඳව මූලික අවබෝධයක් ලබා ගැනීමට හැකිවේ. සුපිළිපන්භාවයෙහි ඇති සාපේක්ෂ වැදගත්කම, භෞතික සම්පත් පුද්ගල සුපිළිපන්භාවය ඉක්මවායන සීමාවන්, මනා සුපිළිපන්භාවයක් ඇති අය තම සමානයන් විසින් දකින ආකාරය යන කරුණු පිළිබඳව අසනලද ප්‍රශ්න ආශ්‍රයෙන් තරුණයන් අතර සුපිළිපන්භාවය හා සම්බන්ධ භූමිකාවන් සහ තත්ත්වයන් පිළිබඳව මූලික අවබෝධයක් ලබාගැනීමට සමීක්ෂණය මගින් හැකියාව ලැබුනි.

### A.1 සුපිළිපන්භාවයෙහි වැදගත්කම පිළිබඳ දැක්ම

තරුණයන් තුළ සුපිළිපන්භාවය පිළිබඳ වැදගත්කමක් ඇතිවීම ශ්‍රී ලංකාවේ ධනාත්මක සමාජ වෙනසක් සඳහා අවශ්‍ය තීරණාත්මක සාධකයකි. සුපිළිපන්භාවයක් නොමැතිවීම (දූෂණයද ඇතුලත්ව) (i) තරුණයින් වශයෙන් තමන්ට, (ii) තම පවුල්වලට සහ මිතුරන්ට, (iii) ව්‍යාපාරවලට සහ පොදුවේ මූල්‍යමය කටයුතු වලට සහ, (iv) රටේ සංවර්ධනයට බලපානා ප්‍රධාන ගැටලුවක් ලෙස දකින්නේදැයි යන ප්‍රශ්ණය සහභාගීවන්නන් ගෙන් ඇසීමෙන් සමීක්ෂණයේ මෙම කොටසේදී මෙම විචල්‍යය පිළිබඳව ගවේශනයක් කිරීමට බලාපොරොත්තු විය.

එහි ප්‍රතිඵල අනුව, සුපිළිපන්භාවය නොමැතිවීම අනෙකුත් කරුණු වලට වඩා තම ජීවිතවලට බරපතල ගැටලුවක් බව සමීක්ෂණයට සහභාගීවූ තරුණයින් බහුතරයක් (84%) විශ්වාස කරයි. එමනිසා ශ්‍රී ලාංකික තරුණයින් තම පුද්ගලික ජීවිත වලටත්, තම පවුල් වලටත්, ආර්ථික දියුණුවට මෙන්ම පොදුවේ රටටත් සුපිළිපන්භාවය වැදගත්වන බව වටහාගෙන ඇති බවට නිගමනය කළ හැකිය.




රූපසටහන A1.1 : සුපිළිපන්භාවය නොමැතිබව බරපතල ගැටලුවක් ලෙස

සමීක්ෂණ දත්තයන්  ස්ත්‍රී පුරුෂ සහ, නාගරික සහ ග්‍රාමීය වශයෙන් වෙන්කළ පසුද සමාන ප්‍රතිඵල දක්නට ලැබුනි.




රූපසටහන් A1.2 : සුපිළිපන්භාවය නොමැතිබව බරපතල ගැටලුවක් ලෙස (ස්ත්‍රී සහ පුරුෂ)

ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව සහභාගීවූවන් අතර අදහස්වල ඉතා සුළු වෙනස්කම් දක්නට ලැබුනු නමුත් ශ්‍රී ලාංකික තරුණයින් අතර සුපිළිපන්භාවය පිළිබඳව ඉතා දැඩි උවමනාවක් සහ උනන්දුවක් ඇති බව පැහැදිලිය. රටේ සුපිළිපන්භාවය සහ දූෂණ නිවාරණය ප්‍රවර්ධනය කිරීමට  මෙම උනන්දුව උත්තේජනයක් ලෙස භාවිතා කළ හැකිය.

ඉලක්කගත ප්‍රදේශ අතරින්  සුපිළිපන්භාවය නොමැතිවීම බරපතල ගැටලුවක් ලෙස අදහස්කරන බව පැවසූ ග්‍රාමීය තරුණයින් සංඛාව නාගරික තරුණයින්ට වඩා 5% පමණ වැඩිවීමක් පෙන්වීය. මෙය පහත සාකච්ඡාකර ඇති ප්‍රවණතාවයන්ට එනම්, ග්‍රාමීය තරුණයින් දූෂණය පිළිගැනීමට වැඩි නැමියාවක් ඇති බව සමග පරස්පරතාවයක් පෙන්වයි.

සුපිළිපන්භාවය නොමැතිවීම බරපතල ගැටලුවක් ලෙස අදහස්කරන බව තරුණ සහ වැඩිහිටි ඇතුළු සමීක්ෂණයට සහභාගීවූවන් අතුරින් බහුතරයකගේ (80% වැඩි) මතය විය. එසේවුවද ග්‍රාමීය සහ නාගරික තරුණයින් අතර ඇති සැලකියයුතු වෙනස මගින් පෙන්වන්නේ නාගරික තරුණයින් තම ග්‍රාමීය සගයන්ට වඩා දූෂණය කෙරෙහි අසංවේදී බවක් දැක්වීම විය හැකිය.




රූපසටහන් A1.3: සුපිළිපන්භාවය නොමැතිබව බරපතල ගැටලුවක් ලෙස (නාගරික සහ ග්‍රාමීය)

ශ්‍රී ලාංකික තරුණයින් සුපිළිපන්භාවය නොමැතිවීම බරපතල ගැටලුවක් ලෙස බොහෝදුරට සමානවම අදහස් කරන බව දත්තයන් මගින් තහවුරු වන නමුත් එම නිගමනය හොඳින්ම වටහා ගත හැක්කේ සුපිළිපන්භාවය යන්නෙහි අර්ථයද එලෙසම වටහාගෙන ඇති බව තහවුරුකර ගැනීමෙනි. සමීක්ෂණයේදී සුපිළිපන්භාවය පිළිබඳ අර්ථ දැක්වීම් තුනක් භාවිතා කළ අතර ඔවුන් එම අර්ථ දැක්වීම් හා එකඟදැයි අසන ලදී.

i) කිසිවිටෙකත් බොරු නොකියන/ වංචා නොකරන නිසා ඔහු / ඇය පිළිබඳව අන්අය විශ්වාසය තබයි.
ii) කිසිවිටෙකත් කුමන හේතුවක් නිසාවත් නීතිය කඩ නොකරයි.
iii) අල්ලස් ගැනීමක් හෝ දීමක් කිසිවිටෙකත් සිදු නොකරයි.




රූපසටහන් A1.4 : ඇය/ඔහු කිසිවිටෙකත් බොරු නොකරන/ අනුන්ට වංචා නොකරන විට සුපිළිපන්භාවය ඇතිවෙයි.




රූපසටහන් A1.5: ඇය/ ඔහු කිසිවිටෙකත් නීතිය නොකඩන නිසා සුපිළිපන්භාවය ඇතිවෙයි.

ඉහත සඳහන් රූපසටහන් අනුව ශ්‍රී ලාංකික තරුණයින් නීතිය කැඩීමට වඩා බොරුකීම සහ වංචාව සුපිළිපන්භාවය නැතිකර ගැනීමක් ලෙස දකින බව පෙන්වා දෙයි. මෙම වෙනස ප්‍රමාණවත් තරම් විශාල නොවන නමුත් දළ වශයෙන් තරුණයින් 22%ක්ද වැඩිහිටියන් 20%ක්ද නීතිය පිළිබඳව විශ්වාසයක් නොමැති බව දක්වා ඇත. එමෙන්ම 15%කට වඩා තරුණයින් බොරුව හෝ වංචාව සුපිළිපන්භාවය කඩවීමක් නොවන බව ඇදහීම විශේෂයෙන් අවධානය යොමුකළයුතු කරුණක් වේ.




රූපසටහන් A1.6: ඇය/ඔහු කිසිවිටෙකත් දූෂණයට සම්බන්ධ නොවන නිසා සුපිළිපන්භාවය ඇතිවෙයි.

ශ්‍රී ලාංකික තරුණයින් බහුතරයක් නීතිය කැඩීමට වඩා දූෂණය සුපිළිපන්භාවය නැතිවීමට හේතුවන්නක් ලෙස අදහන බව වඩා පැහැදිලිය. එසේම වැඩිහිටියන්ට වඩා වැඩි තරුණයින් සංඛ්‍යාවක් දූෂණය සුපිළිපන්භාවය නැතිවීමට හේතුවන බව පිළිගැනීමද සනිටුහන් කළ යුතුය. කෙසේ වෙතත් දූෂණයට සම්බන්ධ වීම නිසා සුපිළිපන්භාවය නැති නොවන බව ශ්‍රී ලාංකික තරුණයින් ගෙන් 14%කගේ අදහස වී ඇත.

## A.2 වටිනාකම්

ශ්‍රී ලාංකික තරුණයින් සුපිළිපන්භාවය අගයන බවද සුපිළිපන්භාවය නැතිවීමේ සාධකයක් ලෙස දූෂණය නීතිය කැඩීමටත් වඩා බරපතල සාධකයක් සේ දකින බවද පැහැදිලි වන අතර මෙම විශ්වාසයන්ට සම්බන්ධ පුද්ගලික වටිනාකම් තහවුරු කර ගැනීමද වැදගත්ය. මෙම වටිනාකම් මැන ගැනීම සඳහා සුපිළිපන් බවෙහි වැදගත්කම සහ පවුලේ ආදායම වැඩිකර ගැනීමේ වැදගත්කම සැසඳිය හැකි ප්‍රශ්න මාලාවක් සහභාගීවූවන් ගෙන් අසන ලදී. විශේෂයෙන්ම ප්‍රශ්නාවලියෙන් පහත සඳහන් ප්‍රශ්න අසන ලදී:

1. පොහොසත් වීම වඩාත් වැදගත් කරුණක් වන බැවින් එම අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා බොරුකීම හෝ වංචාව, සමහර නීති නොසලකා හැරීම සහ බලය අනිසි ලෙස භාවිතය පිළිගත හැකිය.
2. පොහොසත්වීම අවංක වීමට වඩා මදක් වැදගත්ය.
3. අවංක වීම පොහොසත්වීමට වඩා මදක් වැදගත්ය.
4. අවංකවීම පොහොසත් වීමට වඩා ඉතා වැදගත්ය.

මෙහි ප්‍රතිඵල මගින් පැහැදිලි වන්නේ ශ්‍රී ලාංකික තරුණයින් ගෙන් බහුතරයක් සුපිළිපන්භාවය වඩාත් වැදගත් හා වටිනාකම බව අදහන අතර එම සංඛ්‍යාවට බොහෝදුරට සමාන තරුණයින් ප්‍රමාණයක් සුපිළිපන්භාවය මෙන්ම වත්කම්ද වැදගත් වටිනාකම් ලබාදෙන බව විශ්වාස කරයි. වඩාත් සාධනීය කරුණ වන්නේ තරුණයින් ගෙන් 3%ක් පමණක් පොහොසත් වීම වඩා වැදගත්කොට සලකනු ලබන්නේ තරුණයන්ගෙන් 3%ක් පමණක් වීමය.




රූපසටහන් A2.1: ඇය/ඔහු කිසිවිටෙකත් දූෂණයට සම්බන්ධ නොවන නිසා සුපිළිපන්භාවය ඇතිවෙයි.

සමීක්‍ෂණ දත්තයන් ස්ත්‍රීපුරුෂභාවය අනුව බෙදීමේදී තරුණියන් සුපිළිපන්භාවය කෙරෙහි වැඩි වටිනාකමක් තබන අතර පොහොසත් වීම පිළිබඳව දක්වනුයේ සැලකිය යුතු අඩු වටිනාකමකි. ශ්‍රී ලංකාවේ සමාජ වෙනසක් සිදුකිරීමේ ගාමක බලය ලෙස බොහෝවිට කාන්තාවන් ඉදිරියෙන් සිටින බව පෙන්වූ වෙනත් පර්යේෂණ ප්‍රතිඵල මෙම සමීක්ෂණ ප්‍රතිඵල මගින්ද ප්‍රතිරාවය වී ඇත[4]. සමස්ථයක් වශයෙන් සහභාගී වූ තරුණයන් මෙන්ම තරුණියන් ගෙන් 1/3ක් සුපිළිපන්භාවය වඩා වැදගත් බවත් සුපිළිපන්භාවය මෙන්ම වත්කම්ද වැදගත් වටිනාකම් ලෙස පෙන්වාදී ඇත. මෙයින් අදහස් කෙරෙන්නේ ශ්‍රී ලාංකික තරුණයින් මෙම ප්‍රශ්නය දෙස ප්‍රායෝගිකව පිවිසෙන බවය. එනමුත් තරුණයින් සුපිළිපන්භාවය පිළිබඳ ප්‍රතිපත්තීන් සහ වටිනාකම් කෙරෙහි කෙතරම් ගැඹුරට කැපවී ඇත්දැයි යන ප්‍රශ්නය පැන නගී.




රූපසටහ A2.2: වඩාත් වැදගත් වන්නේ කුමක්ද? ආදායම වැඩිකර ගැනීමද, අවංක හා නීතිගරුක වීමද?

සමීක්ෂණයේදී නීතිය සම්බන්ධයෙන් තරුණයන්ගේ ඇගයීමද විමසන ලදී. මෙහිදී ලද ප්‍රතිඵල විශේෂයෙන්ම ගැටලුකාරී විය. වැඩිහිටියන් මෙන් නොව තරුණයින් අවංකවීම සහ නීතිගරුකවීම පිළිබඳව ඉතා අඩු වැදගත්කමක් දක්වා තිබුනි. ස්ත්‍රීපුරුෂභාවය අනුව සලකා බලන විට තරුණියන් ආදායම කෙරෙහි අඩු වැදගත්කමක්ද සුපිළිපන්භාවය කෙරෙහි වැඩි වටිනාකමක්ද ලබා දී තිබුනි. තරුණයින්ගේ සහ වැඩිහිටියන්ගේ ප්‍රතිචාර අතර වෙනස කුඩාවන නමුත් (4 -6%) එයින් ගම්‍ය වන්නේ තරුණ පරපුර තුළ නීතිය පිළිබඳව අඩු විශ්වාසයක් පවතින බවයි. A2.2 රූපසටහන් වලින් දැක්වෙන පරිදි බොරුකීම, වංචාව හෝ දූෂණයට වඩා නීති ගරුක නොවීමට අඩු වැදගත්කමක් පෙන්වා ඇත. සමීක්ෂණය සඳහා වූ වැඩිහිටියන්ට වඩා තරණයින්ගේ සංඛ්‍යාවද අඩුය.

## A.3 ආකල්ප

සුපිළිපන්භාවයක් සහිතව ජීවත් වීමට කැපවීසිටින තරුණයන්ට පවා එම සුපිළිපන්භාවය කඩ කිරීමට සිදුවන පීඩනයන්ට මුහුණදීමට සිදුවනු ඇත. ශ්‍රී ලාංකික තරුණයින් සුපිළිපන්භාවය මූල්‍යමය සාර්ථකත්වය හමුවේ පාවාදිය යුත්තක් ලෙසට දකින්නේද නැතහොත් සුපිළිපන්භාවය මූල්‍ය සාර්ථකර්වයට අත්වැලක් වන්නේද යන කරුණ පිළිබඳව සමීක්ෂණයේ මෙම කොටසේදී සලකා බලන ලදී. සුපිළිපන්භාවය මූල්‍ය සාර්ථකත්වය හමුවේ පාවාදිය යුත්තක් ලෙස සලකන්නේ නම් තරුණයන්ට සුපිළිපන්භාවය රැකගනිමින් දූෂණයට එරෙහිව සටන් කිරීමට අති හැකියාවට ඍණාත්මක පීඩනයක් ගෙන දෙන්නේය.

ප්‍රධාන අනාවරණයන්




රූපසටහන් A3.1: සුපිළිපන්භාවය ඇති අය වංචනිකයන්ට වඩා සාර්ථකභාවයට පත්වීමට බොහෝදුරට ඉඩකඩ පවතී?

ශ්‍රී ලාංකික තරුණයන් සහ තරුණියන් යන දෙපාර්ශවයම සුපිළිපන්භාවය ඇති අයට සාර්ථක විය හැකිය යන විශ්වාසයෙන් පසුවීම ධනාත්මක ප්‍රවනතාවයකි. එනමුත් තරුණයින් ගෙන් 1/3 ක් පමණ සිතන්නේ සාර්ථකත්වය සඳහා වංචාකළ යුතු බවය. මෙම ප්‍රවනතාවය තරුණියන්ට වඩා තරුණයන් අතරේ කැපී පෙනෙන අතර ඔවුන්ගෙන් පූර්ණ 1/3ක්ම පවසන්නේ සාර්ථකත්වය සඳහා වංචාව අවශ්‍යය බවය.




රූපසටහන් A3.2: සුපිළිපන්භාවය ඇති අය වංචාකරන්නන්ට වඩා සාර්ථකවන්නේද? (අධ්‍යාපන මට්ටමට අනුව)

දත්තයන් අධ්‍යාපනික මට්ටම් අනුව බෙදා වෙන්කළ විට වඩාත් ගැටලු සහගත ප්‍රතිඵල ලැබුනි. අඩුම අධ්‍යාපන මට්ටම් සහිත අය සාර්ථකත්වය සඳහා හොඳම මාවත සුපිළිපන්භාවය බව පවසා ඇති බව පැහැදිලිය. ඒ අතර තෘතීයික අධ්‍යාපනය ලැබූවන්ගෙන් තිදෙනෙකුගෙන් එක් අයෙකුගේ විශ්වාසය වූයේ දූෂණය සහ වංකභාවය සාර්ථකත්වයට මඟ පෙන්වන බවය. මෙය ගැටලුකාරී තත්වයක් වන්නේ ආර්ථික පද්ධතිය පිළිබඳව වඩාත් හොඳින් වටහාගත් කණ්ඩායම සාර්ථකත්වය ලඟාකර දෙන මාවත දූෂණය හරහා වැටී ඇති බව විශ්වාස කිරීමය. එමෙන්ම සාර්ථකත්වයට පත්වූ අය මෙසේ විශ්වාස කරන බවද මෙයින් පෙන්වාදෙයි. තරුණයින් තරම් ප්‍රබලව නොවුනද මෙම ප්‍රවණතාවය වැඩිහිටියන් සඳහාද එසේමය. සාර්ථකත්වයේ මාවතේ ඉදිරියට යනවිට දූෂණයද වැඩිවන බව මේ අනුව ප්‍රත්‍යක්ෂ වේ. මෙම ප්‍රවනතාවය පිළිබඳව ඉදිරියේදී නිසැකයෙන්ම තවදුරටත් සොයා බැලිය යුතුය.

## A.4 සුපිළිපන්භාවය කැපකිරීමට ඇති කැමැත්ත

සුපිළිපන්භාවය සඳහා කැපවන බව ප්‍රකාශ කිරීම පහසුය. එනමුත් සුපිළිපන්භාවය අභියෝගයට ලක්වන අවස්ථාවලදී එම කැපවීම කොතරම් ගැඹුරට පවතින්නේ දැයි දැනගැනීමට හැකියාව ලැබේ. මෙම තොරතුරු හඳුනාගැනීම සඳහා සුපිළිපන්භාවය රැකගැනීම වියදම වැඩිවන කරුණක් වන විට බොරුකීමට, වංචාකිරීමට සහ අල්ලසට කැමැත්ත ඇතිකරගන්නා කෙනෙකුගේ සුපිළිපන්භාවය ගැන සහ පවුලේ සමගිය වෙනුවෙන් සුපිළිපන්භාවය හානිකරගන්නා අය පිළිබඳව සහභාගීවන්නන් ගෙන් විමසන ලදී.




රූපසටහන් A4.1: වංචා කිරීම හෝ බොරුකීම සිදු නොකළහොත් පාඩු සිදුවිය හැකි අවස්ථාවකදී සුපිළිපන්භාවය පිළිබඳ පුද්ගලයකුගේ දැක්ම (වැඩිහිටි , තරුණ)




රූපසටහන් A4.2: නීතියට පිටුපෑමට වඩා පවුලේ සමගිය අගයකරන පුද්ගලයෙකුගේ සුපිළිපන්භාවය පිළිබඳ දැක්ම (වැඩිහිටි, තරුණ)

වියදම් සහ පවුලේ අගයන් සමග සුපිළිපන්භාවය මැනීමට සමීක්ෂණයට සහභාගීවූවන්ගෙන් ඉල්ලා සිටි විට පුදුමයකට මෙන් ලැබුනු ප්‍රතිඵලවල ඉතා සාර්ථක බලපෑමක් දක්නට ලැබුනි. කිසියම් තත්වයක් යටතේ පුද්ගලයකු බොරු කියමින් වංචාකරමින් නීති විරෝධීව කටයුතු කරනවානම් එම පුද්ගලයා සුපිළිපන් පුද්ගලයෙක්දැයි තරුණයින්ගෙන් විමසන ලදී. ශ්‍රී ලාංකික තරුණයින් ගෙන් 47%ක්ම ප්‍රකාශ කර සිටියේ එසේ නොකර සිටීමෙන් පාඩු සිදුවන තත්වයක් යටතේ නොවැලැක්විය හැකි අවස්ථාවක බොරුකීම හෝ වංචාකිරීම නිසා සුපිළිපන්භාවයට හානියක් සිදු නොවන බවය. බහුතරයක් තරුණයින් (56%) කියා සිටියේ පවුලේ සමගිය වෙනුවෙන් නීතියට පිටපෑම නිසා සුපිළිපන්භාවයට හානියක් සිදු නොවන බවය.




රූපසටහන් A4.3: සුපිළිපන්භාවය සහිත පුද්ගලයෙකු දූෂණයේ යෙදෙන්නේ වියදම අවම වූ විටය.

අවසාන වශයෙන්, ශ්‍රී ලාංකික තරුණයින් බහුතරයක් කුඩා පරිමානයේ දූෂණයන් සිදුකිරීම සුපිළිපන්භාවයට හානියක් සේ නොසලකයි. මෙම ගැටළුකාරී සොයාගැනීම පෙන්වාදෙනු ලබන්නේ කුඩා පරිමාණ දූෂණය නිසා සිදුවන බරපතල ප්‍රතිවිපාකයන් පිළිබඳව තවදුරටත් අධ්‍යාපනයක් සහ දැනුමක් ලබාදීම අවශ්‍ය බවය. සුපිළිපන්භාවය පිළිබඳව අර්ථදැක්වීමේදී වැඩිහිටියන්ට වඩා තරුණයින් අඩු ප්‍රතිශතයක්වුවද නම්‍යශීලී බවක් දැක්වීම විශේෂයෙන් සඳහන් කළ යුතුය.




රූපසටහන් A4.4: බොරුකියන/වංචාකරන, නීතියට වඩා පවුල අගයන හෝ සුලු අල්ලස් ලබාදෙන අයගේ සුපිළිපන්භාවය පිළිබඳ නාගරික සහ ග්‍රාමීය දෘෂ්ඨිකෝණයෙන් වූ දැක්ම

සුපිළිපන්භාවයෙහි අන්තර්ගතය පිළිබඳව තදබල නොවූ අදහසක් දරන බවට පෙන්වූ ග්‍රාමීය තරුණයන් අතර මෙම ප්‍රවණතාවය විශේෂයෙන්ම දක්නට ලැබුනි. එනමුත් ඔවුන් නාගරික තරුණයන්ට වඩා සුපිළිපන්භාවය අගය කරන ලදී. මෙම ප්‍රවණතාවය පවුලේ එකමුතුව සහ කුඩා අල්ලස් ගෙවීම පිළිබඳ ප්‍රශ්න වලදීද දක්නට ලැබුනි. මෙයට ඇති හේතු සංකීර්ණය. ග්‍රාමීය තරුණයින් නාගරික තරුණයින්ට වඩා දූෂණය සමග ගනුදෙනු කිරීමේ අවස්ථාවන්ට මුහුණදෙනවා විය හැකිය. එමනිසා තම වටිනාකම් ඔවුන්ගේ ජීවන යථාර්තයන් සමග ගලපාගැනීමට ඔවුන්ට සිදුවී ඇත[5]. අධ්‍යාපනයට සහ මාධ්‍යය ඇසුරුකිරීමට වැඩි අවස්ථා ලබන නාගරික තරුණයා තුළ සුපිළිපන්භාවය කඩවීම් ඉවසීමේ ස්වභාවය අඩුවීමද තවත් හේතුවක් විය හැකිය.

සාමූහිකව, මෙම ප්‍රතිඵල වලින් පෙන්වන්නේ ශ්‍රී ලාංකික තරුණයා සුපිළිපන්භාවය නොසෙල්විය හැකි ප්‍රතිපත්තියක් ලෙස නොදකින බවය. ඔවුන් සුපිළිපන්භාවයට සහාය දක්වන අතරම එයින් තමන්ට පුද්ගලිකව පාඩු සිදුවන විට හෝ පවුල් සබඳතා වලට හරස් වන විට සුපිළිපන්භාවය නොසලකා හරිති. සමස්ත ශ්‍රී ලාංකික තරුණයන් ගෙන් අඩකට ආසන්න සංඛ්‍යාවක් මූලික වශයෙන් සුපිළිපන්භාවය ආදායමට වඩා වැදගත් ලෙස නොසැලකීම මෙම කරුණ සනාථ කරයි. (A4.1,2,3,4).

වෙන් වෙන්ව ගත් කල ශ්‍රී ලාංකික තරුණයා පවුලේ සුපිළිපන්භාවය සහ වියදම් වලක්වාගැනීම පිළිබඳව වැඩි වටිනාකමක් ලබාදෙන අතර කුඩා ප්‍රමාණයේ දූෂණයන් නොසලකාහරින බව ප්‍රතිඵල වලින් නිරූපනය වේ. සුපිළිපන්භාවය සම්බන්ධ පොදු අවබෝධය පිළිබඳ ප්‍රශ්නය සමීක්‍ෂනයේදී මතුවේ. කෙසේ නමුත් පවුල් වටිනාකම් සහ වියදම් වලක්වාගැනීම සුපිළිපන්භාවය ප්‍රවර්ධනය කිරීමේ හා දූෂණය වැලැක්වීමේ ක්‍රියාමාර්ගයන්හීදී ශක්තිමත් බලවේගයන් ලෙස යොදාගත හැකි බව තහවුරු වේ.

## B. දූෂණය පිළිබඳ අත්දැකීම්

දූෂණය ලොවපුරා පවතින යථා තත්ත්වයකි. එනමුත් තරුණයින් දූෂණයෙහි නියැලෙන ප්‍රමාණය ඔවුන් සුපිළිපන්භාවය දකින ආකාරය, රාජ්‍ය තන්ත්‍රය කෙරෙහි ඔවුන්ගේ ඇති විශ්වාසය සහ සමාජය වෙනස්කරන්නන් ලෙස කටයුතු කිරීමට ඔවුන්ගේ ඇති කැමැත්ත කෙරෙහි සැලකියයුතු බලපෑමක් ඇති කරයි. මෙම ප්‍රශ්ණය විසඳාගැනීම සඳහා සමීක්ෂණයට සහභාගීවන්නන් විසින් පසුගිය වසර තුළ දූෂණය පිළිබඳව ලද අත්දැකීම් වාර්තා කරන ලෙස ඉල්ලා සිටින ලදී. තරුණයන්ට මුහුණපෑමට සිදුවිය හැකි විවිධ වර්ගයේ දූෂණ ඇතුළත්වන පරිදි ප්‍රශ්න වෙන් කරන ලදී. ස්ත්‍රීපුරුෂභාවය, පදිංචිය සහ අධ්‍යාපනික සුදුසුකම් වැනි කරුණුද භාවිතාකරමින් අතිරේක විශ්ලේෂණයන් සිදුකරන ලදී.




රූපසටහන B.1: ප්‍රදේශ හයෙහි තරුණ සහ වැඩිහිටි අය අතර දූෂණය පිළිබඳ අත්දැකීම්

දූෂණයෙහි යෙදී සිටින තරුණයින්ගේ ප්‍රතිශතය ඉතා කුඩා බව මෙම රූපසටහන පැහැදිලිව පෙන්වයි. වඩාත් සුලබ දූෂණයන් සිදුවී ඇත්තේ රාජ්‍ය පරිපාලනයේ සහ පොලිස් දෙපාර්තමේන්තුවේය. ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ දූෂණය බරපතල ගැටලුවක් බවට පවත්නා පිළිගැනීම මෙම සමීක්‍ෂණය හරහා නැවත සනාථ වේ. අධ්‍යාපනයේ සහ වෛද්‍ය සේවාවල දක්වා ඇති සාපේක්ෂව අඩු දූෂණ ප්‍රමාණයන් සතුටුදායක තත්ත්වයකි. සුපිළිපන්භාවය ඇති අය අධ්‍යාපනයෙන් බැහැර කිරීමෙන් සහ සෞඛ්‍ය සේවා සඳහා ඇති

මූලික අයිතීන් උල්ලංගඝණය කරමින් සිදුවන මෙම ක්ෂේත්‍රවල දූෂණය සමාජය සැබවින්ම පීඩාවට පත්කරන්නට සමත් වේ. ප්‍රතිඵල වැඩිදුරටත් පෙන්වා දෙන්නේ තරුණයින්ට වඩා වැඩිහිටියන් සුළු වශයෙන් හෝ වැඩිපුර දූෂණයේ නියැලෙන බවය. වැඩිහිටියන්ගේ මෙම ක්‍රියාවන් ආර්ථිකයට සහ සමාජ පද්ධතියට වැඩි බද්ධවීමක් නිසා සිදුවේදැයි පැහැදිලි නැත. කෙසේවෙතත් තරුණයින් හා වැඩිහිටියන් අතර ඇති මෙම වෙනස වැඩිදුර අධ්‍යයනයක් කිරීමට තරම් සැළකිය යුතු තත්වයක් නොවේ.




රූපසටහන B.2: තරුණ සහ වැඩිහිටි අය අතර දූෂණය පිළිබඳ අත්දැකීම් සහ ස්ත්‍රීපුරුෂභාවය හා හරස් සංසන්දනයක්

ස්ත්‍රීපුරුෂභාවය අනුව සහභාගීවූවන් බෙද සංසන්දනය කිරීමේදී දූෂණය පිළිබඳ ගැහැනු පිරිමි දෙපාර්ශවයේ අත්දැකීම් අතර සැලකියයුතු වෙනස්කම් දක්නට ලැබුණි. කාන්තාවන් හා සැසඳීමේදී පිරිමි සහභාගීවූවන් දූෂණය හා සම්බන්ධ වීමේ අවස්ථා වැඩිය. (B.2) සැලකිය යුතු වෙනස්කම් දක්නට ලැබුනේ රාජ්‍ය අංශයේ දූෂනයන් හා සම්බන්ධවය. පුද්ගලික අංශයේ අල්ලස් ඉල්ලීමේ අවස්ථා දෙපාර්ශවයේම බොහෝදුරට සමාන විය.

පොලිසිය හා සම්බන්ධ දූෂණ අත්දැකීම් ලැබූ පිරිමින් ගේ සංඛ්‍යාව වැඩිවිය. පිරිමින් සිව් දෙනෙකුගෙන් එක් අයෙක් පසුගිය වසර තුළ පොලිසිය මගින් අල්ලස් ඉල්ලූ අවස්ථාවන්ට මුහුණ දී තිබුඹ. එමෙන්ම ලිපි ලේඛන හා බලපත්‍ර ලබාගැනීමේ දී පිරිමින් පස්දෙනෙකුගෙන්ම එක් අයෙක් අල්ලස් අත්දැකීම් ලබා තිබුණි. ශ්‍රී ලාංකික සමාජයේ සම්ප්‍රදායික ලිංගික ක්‍රියාවලින් සමග මෙම අත්දැකීම් ගැලපේ. වාහන පැදවීම වැඩිවශයෙන් සිදුකරන්නේ සහ ඒ අනුව පොලිසිය හා රාජ්‍ය නිලධාරීන් සමග සම්බන්ධ වන්නේ පිරිමින්ය. මේ නිසා පිරිමින් දූෂණ අත්දැකීම් වැඩියෙන් ලැබීම පිළිගතහැකි තත්වයක් වන අතර ගැහැනුන් පිරිමින් සමග සමාජයේ සමානාත්මතාවයෙන් කටයුතු කිරීමේදී ඔවුන්ටද දූෂණ සම්බන්ධ අත්දැකීම් වැඩිවනු ඇත.

අධ්‍යාපන මට්ටම, සිවිල් සමාජය සමග සම්බන්ධවීම හෝ පදිංචිය වැනි ජනවිකාශන සාධකයන් දූෂිත ගණුදෙනු සම්බන්ධයෙන් සංඛ්‍යාලේඛණාත්මකව සාර්ථක බලපෑමක් සිදු කිරීමක් නොපෙන්වීම විමතියට කරුණකි.

## B.1 **රාජ්‍ය ආයතන පිළිබඳ අවබෝධය**

ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආයතන ගෞරවයට පාත්‍ර වී නොමැති අතර ඒවා නිරතුරුව දූෂණ චෝදනා ලබයි[6]. එම නිසා සමීක්ෂණයේ කොටසක් මෙම රාජ්‍ය ආයතන පිළිබඳව තරුණයිගේ දැක්ම සොයා බැලීම සඳහා යොදගනීමට TISL ආයතනය තීරණය කරන ලදී. බොහෝ දෙනා නිතර සම්බන්ධ වන රාජ්‍ය ආයතන වන්නේ පොලීසිය, ප්‍රාදේශීය පරිපාලන ආයතන, ජාතික සෞඛ්‍ය සේවා ආයතන සහ අධ්‍යාපන ආයතනයන්ය. එම නිසා මෙම ආයතන පිළිබඳ මහජන අදහස් මගින් රජය පිළිබඳව සහ පොදුවේ නීතිය ක්‍රියාත්මකවීම පිළිබඳව ඔවුන්ගේ දැක්ම මගින් දැඩි බලපෑමක් සිදුකළ හැකිය.




රූපසටහන B.1 -1: රාජ්‍ය ආයතනවල සමස්ථ ක්‍රියාකාරිත්වය පිළිබඳ දැක්ම

පුද්ගලික අධ්‍යාපනය, සෞඛ්‍යය සහ ව්‍යාපාර ගරුත්වය අතින් ඉහල අගයක් පෙන්වූ අතර සමස්තයක් වශයෙන් රාජ්‍ය ආයතන දුර්වල තත්වයක පැවතුණි. සෘජු සංසන්දනයක් කිරීමේදී තරුණයින් පුද්ගලික ආයතන කෙරෙහි විශ්වාසයක් ඇති බව හෙලිවූ අතර රාජ්‍ය සෞඛ්‍ය සේවය සඳහා ඉහල පිළිගැනීමක් පෙන්වනු ලැබීය. මානයේ අනෙක් අන්තය දෙස බලන විට සහභාගී වූවන් අඩකට වඩා පොලිස් සේවය 'නරක' හෝ 'ඉතා නරක' ලෙස වර්ග කර තිබුණි. සහභාගීවූවන් ගෙන් අඩකට වඩා අහිතකර ලෙස වර්ග කර තිබුනේ පොලීසිය පමණක් වන නමුත් ප්‍රාදේශීය සහ ජාතික පරිපාලන ආයතනයන්ද ඒ ආසන්නයේම විය.මෙම ආයතන 'හොඳ' හෝ 'ඉතා හොඳ' ලෙස හඳුනාගෙන සිටියේ සුළු බහුතරයක් පමණකි.




1. ඉතා හොඳයි 2. තරමක් හොඳයි 3. තරමක් නරකය 4. ඉතා නරකයි

රූපසටහන B.1 -2: විවිධ රාජ්‍ය සේවා ආයතනවල සුපිළිපන්භාවය පිළිබඳ දැක්ම

ප්‍රධාන අනාවරණයන්

## B.2 දූෂණයෙහි නියැලීමට ඇති කැමැත්ත

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ආයතනය විසින් දූෂණය අර්ථ දක්වා ඇත්තේ 'පැවරී ඇති බලය පුද්ගලික ලාභය සඳහා අයථාලෙස භාවිතාකිරීම' ලෙසය. (ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් සරල උපදෙස් සංග්‍රහය, 2009). කෙසේනමුදු දූෂණය විවිධ ක්‍රම සහ විධි වලින් පැමිණේ. අල්ලස, ඥාතිසංග්‍රහය, වංචනික පරිහරණය, බලහත්කාරය, අහිමතය අයුතු ලෙස ලබාදීම, අනිසි අනුග්‍රහයන් මේ අතරින් කිහිපයකි. මෙම දූෂණයන් බොහොමයක් සඳහා දෙපාර්ශවයක් අවශ්‍යය. එක් පාර්ශවයක් දූෂණය සිදුවීම ප්‍රතික්ෂේප කළ හොත් ඉතා දූෂිත නිලධාරීන් පවා මැඩලිය හැකිය.

එම නිසා වාර්තාවේ මෙම කොටසේදී ශ්‍රී ලාංකික තරුණයින් විවිධ දූෂිත ගණුදෙනුවල නියැලීමට ඇති කැමැත්තෙහි ප්‍රමාණය පිළිබඳව සොයාබැලීමට TISL ආයතනය තීරණය කරන ලදී. දූෂණය සිදුවන අවස්ථා හතරක් සමීක්ෂණයේදී විශේෂයෙන් හඳුනාගන්නා ලදී. (B.2-1). පහත සඳහන් කරුණුවලින් එකක් සපුරාග ැනීමට අවස්ථාව ලැබේ නම් සදාචාරාත්මක නොවන හෝ දූෂිත ඉල්ලීමකට තමන් ප්‍රතිචාරය දක්වන්නේ කෙසේදැයි සමීක්ෂණයට සහභාගීවූවන් ගෙන් අසන ලදී:

1. වැදගත් විභාගයක් සමත්වීම
2. වැදගත් ලිපියක් හෝ ලේඛණයක් ලබාගැනීම
3. හොඳ පාසැලකට / සමාගමකට ඇතුල්වීම
4. මහත් බලාපොරොත්තු තැබූ රැකියාවක සම්මුඛ පරීක්ෂණය සමත් වීම




රූපසටහන B.2 -1: කිසියම් ප්‍රයෝජනයක් ලබාගැනීම සඳහා දූෂිත ගනුදෙනුවක නියැලීමට ඇති කැමැත්ත




රූපසටහන B.3 -1: වංචාකර සමත්වනවාට වඩා විභාගයක් අසමත්වීමට ඇති කැමැත්ත

අධ්‍යාපනයට අදාලව වංචාවෙන් ඉදිරියට යාමට බහුතරයක් ශිෂ්‍යයෝ කැමැත්තක් නොදක්වන බව ඉහත දත්තයන් ගෙන් සනාථ වේ. අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ දූෂණයෙහි යෙදෙන්නේ ශිෂ්‍යයන් අතුරින් ඉතා කුඩා සංඛ්‍යාවක් බව දැක්වූ ප්‍රතිඵලය මෙයින්ද තහවුරු වේ. (B.3-1). ඇත්තෙන්ම අධ්‍යාපන ක්ෂේත්‍රයේ දූෂණයෙහි යෙදුනු බව පැවසූ ශිෂ්‍ය සංඛ්‍යාව විභාගය සමත් වීමට ඕනෑම දෙයක් කරන්නට කැමති ශිෂ්‍ය සංඛ්‍යාව හා බොහෝදුරට සමාන විය. මෙම ශිෂ්‍යයින්ට අවස්ථාව ලැබුනහොත් ඕනෑම අවස්ථාවක තම ගුරුවරුන්ට අල්ලස් දීමට සූදානම් බව මෙයින් පැහැදිලි නමුත් මෙම ප්‍රශ්නය සම්බන්ධයෙන් තවදුරටත් පර්යේෂණ කිරීම අවශ්‍යය.




රූපසටහන B.3 -2: වංචාකර සමත්වනවාට වඩා විභාගයක් අසමත්වීමට ඇති කැමැත්ත - ස්ත්‍රී/පුරුෂභාවය අනුව

ප්‍රධාන අනාවරණයන්

සුපිළිපන්භාවය රැකගැනීම කෙරෙහි තරුණයන්ට වඩා තරුණියන් ගේ කැපවීම පෙන්වීම තුළින් අධ්‍යාපන විෂයයෙහි ලිංගික වෙනස්කම කැපී පෙනේ. B.3-2, රූපසටහනෙහි දැක්වෙන පරිදි තරුණයින්ගෙන් 30% ක්ම තම විභාග සමත්වීම සඳහා කුමන ආකාරයක හෝ සදාචාරාත්මක නොවන ක්‍රියාවක යෙදීමට සූදානම් බව පෙන්වා ඇත. 5%ක් පමණක් සමත්වීම සඳහා ඕනෑම දෙයක් කරන බව පවසා ඇති නමුත් මෙය අවධානය යොමුකළ යුතු හෙළිදරව්වකි.




රූපසටහන B.3 -3: වංචාකර සමත්වනවාට වඩා විභාගයක් අසමත්වීමට ඇති කැමැත්ත - පදිංචිය අනුව

ග්‍රාමීය සහ නාගරික වශයෙන් වෙන්කිරීමේදී ද සමීක්ෂණයේදී හෙළිදරව්වූ පොදු ප්‍රවනතාවයම තහවුරු විය. ග්‍රාමීය ශිෂ්‍යයින් දූෂණයෙහි නියැලීමට පෙළඹෙන අතර සදාචාරාත්මක හැසිරීම සඳහා කැපවීම අඩුවෙන් පෙන්වා ඇත. කෙසේ නමුත් ප්‍රතිඵලය මගින් ගුරුවරුන් දූෂිත ඉල්ලීම් සිදුකිරීම ඉහල මට්ටමක පැවතීමක් පෙන්නුම් කරන්නේදැයි මෙම සමීක්ෂණයෙන් සනාථ කළ නොහැක.

## B.4 වැදගත් ලේඛනයක් ලබාගැනීම

අනෙක් ක්ෂේත්‍රවලට වඩා රාජ්‍ය නිලධාරීන් හා සම්බන්ධ දූෂිත ක්‍රියාවන්හි නියැලීමට සමීක්ෂණයට සහභාගීවූවන් වඩා වැඩි කැමැත්තක් දක්වන බව හෙළිවිය. වැදගත් ලිපි ලේඛන ලබා ගැනීම සඳහා සදාචාරාත්මක නොවන හැසිරීම්වල නියැලීමට තරුණයින් ගෙන් 30%ක්ම කැමැත්ත පළ කළ අතර 10% කට ආසන්න තරුණයින් සංඛ්‍යාවක් අල්ලස් දීමටද ඉදිරිපත් වනු ඇත. රාජ්‍ය ආයතන ක්‍රියාකාරීත්වය පිළිබඳ ප්‍රතිඵල (B.4-1,2) අනුව තරුණයින්ගේ සදාචාරාත්මක ප්‍රමිතීන්ගේ කිසියම් වෙනසක් සිදුකරග න්නවා වෙනුවට දූෂණයට ප්‍රතිචාර දැක්වීම කෙරෙහි වැඩි ප්‍රවනතාවයක් දක්වන බව පෙන්වා ඇත. B.4-1 රූපසටහනේ දැක්වෙන ප්‍රතිඵලය තරුණයින්ගේ සදාචාරය පිළිබඳ ප්‍රශ්නයකට වඩා රාජ්‍ය නිලධාරීන්ගේ දුර්වල කාර්ය සාධනය පිළිබඳ ප්‍රතිඵලයක් සේ පෙනේ.




රූපසටහන B.4-1: වැදගත් ලේඛන ලබාගැනීම සඳහා අල්ලස් ලබාදීමට ඇති කැමැත්ත, ස්ත්‍රීපුරුෂභාවය අනුව

කෙසේ වෙතත් ග්‍රාමීය සහභාගීවූවන් අන් අයගේ සහාය ගැනීමට හෝ අයථා ගෙවීමක් සිදුකිරීමට වැඩි ප්‍රවනතාවයක් දැක්වීම මගින් නාගරික/ග්‍රාමීය වෙනස පැහැදිලිව දක්නට හැකිය. නාගරික සහ ග්‍රාමීය තරුණයින් වෙන් කිරීමේ පුළුල් ප්‍රවනතාවය හා එකඟ නොවන නමුත් මෙය ග්‍රාමීය ප්‍රදේශවල රාජ්‍ය නිලධාරීන්ගේ අතිශය දුර්වල ක්‍රියාකාරීත්වය කෙරෙහි දක්වන ලද ප්‍රතිචාරයක් ලෙස දැක්විය හැකිය.




රූපසටහන B.4-2: වැදගත් ලිපිලේඛන ලබාගැනීම සඳහා අල්ලස් ලබාදීමට ඇති කැමැත්ත, පදිංචිය අනුව

## B.5 **රැකියා ලබාගැනීම සඳහා ආචාර ධර්ම බිඳලීම**

මෙම ප්‍රශ්නයේදී සදචාර නොවන ක්‍රමයකට රැකියාවක් හෝ පාසැලකට ඇතුල්වීමට අවස්ථාවක් ලබාදීම හෝ ඔවුන් වඩාත්ම ප්‍රිය කළ සහ අපේක්ෂා කළ රැකියාව ලබාගත හැකිවන්නේ නම් ඔවුන් ප්‍රතිචාර දක්වන්නේ කෙලෙසකදැයි සමීක්ෂනයට සහභාගීවූවන්ගෙන් අසන ලදී. ඔවුන් 'ඔව්' සහ 'නැත' අතර ලබාදිය හැකි ප්‍රතිචාරයන් හතරකින් එකක් තෝරාගන්නා ලදී.




රූපසටහන B.5-1: සදාචාරසම්පන්න නොවන අයුරින් රැකියාවකට හෝ පාසැල් ඇතුල්වීමකට ඇති කැමැත්ත, පදිංචිය අනුව

සාමාන්‍ය පාසැල් ඇතුලත්වීම සඳහා හෝ රැකියාවක් ලබාගැනීමක් සඳහා තමන් සදාචාරාත්මක නොවන යෝජනාවකට කැමැත්ත පළකරන බව තරුණයින් ගේ අති බහුතරයක් ප්‍රකාශ කරන ලදී. (B.5-1). ග්‍රාමීය සහභාගීවූවන්ගෙන් 17%ක් පමණක් තමන් කෙලින්ම සදාචාර නොවන යෝජනාව ප්‍රතික්ෂේප කරනු ලබන්නේ නාගරික සහ ග්‍රාමීය සහභාගීවූවන් අතර සැලකියයුතු වෙනසක් දක්නට ලැබුණි. නාගරිකයින් දක්වන ලද ප්‍රතිචාරය ඊට වඩා මදක් පරිපූර්ණත්වයෙන් යුක්තය. එනමුත් කිසියම් ඇතැම් අවස්ථාවකදී 73%ක් යෝජනාව පිළිගනී. මෙම සංඛ්‍යාව මෙතරම් ඉහල අගයක් ගනු ලැබුයේ සංස්කෘතික සහ ආර්ථික කරුණු වල ඒකාබද්ධ ප්‍රතිඵලයක් නිසා විය හැකිය.

ආර්ථික වශයෙන් ගත් කල අධ්‍යාපනික සහ ආර්ථික අවස්ථා ශ්‍රී ලංකාවේ විරල ව දකින්නට ලැබෙන අතර දුශ්කරබව සාපේක්ෂ ලෙස ඉහල මට්ටමක පවතී. බොහෝවිට සහභාගීවූවන් ඔවුන්ගේ පෞද්ගලික තත්ත්වය පිළිගනිමින් 'නැත' යනුවෙන් පැවසිය නොහැකි නිසා මෙම ප්‍රශ්ණයට යථාවාදීව සහ ප්‍රායෝගිකව පිළිතුරු දුන්නා විය හැකිය.

සංස්කෘතියද මෙහිදී බලපෑමක් ඇති කරයි. මෙය සාමාන්‍ය දෙයක් ලෙස සලකා පිළිගන්නා බව නාගරික තරුණයින් 22%ක්ද ග්‍රාමීය තරුණයින් 36%ක්ද පවසන ලදී. තවත් නාගරික තරුණයින් 40%ක්ද ග්‍රාමීය තරුණයින් 23%ක්ද  පවසන ලද්දේ තමන් මෙය පිළිගන්නේ එම අවස්ථාව ලබාදුන් ඥාතියා සතුටු කිරීමට බවය. මෙම ප්‍රතිචාරයන්ගෙන් පෙනී යන්නේ ශ්‍රී ලාංකිකයන් තම රැකියාවේ සහ පාසැලේ ඉදිරියට යාම සඳහා පුද්ගලික සබඳතා සහ ඥාතිසංග්‍රහය මත බෙහෙවින් විශ්වාසකරන බවකි.මෙය දකුණු ආසියාවේ අනපේක්ෂිත තත්වයක් නොවන නමුත් එය බෙහෙවින් අර්බුධකාරී ද වේ. නාගරික/ග්‍රාමීය වෙන්කිරීම්වලදී තවදුරටත් පෙනීයන්නේ සදාචාරවත් නොවන රැකියා ලබාදීම් සහ පාසැල් ඇතුල්කිරීම් සාමාන්‍ය සංසිද්ධියක් වන බවය. කෙසේනමුත් නාගරික පරිසරයේදී 40%ක් සහභාගීවූවන් පැවසුවේ සදාචාර නොවන අන්දමින් රැකියාවක් හෝ පාසලකට ඇතුලත්වීමේ අවස්ථාව ඥාතියෙකු විසින් සලසා දෙන්නේනම් ඔවුන් ඒ පිළිබඳව අහිතක් නොසිතන බවය. ශ්‍රී ලාංකික තරුණයින් සමාජයේ සුපිළිපන්භාවය පිළිබඳව සංකල්ප නැංවීමට නම් මෙම සංස්කෘතික කඩඉම් බිඳහල යුතුය.

## B.6 'සිහින' රැකියා ලබාගැනීම

කෙසේනමුදු, 'සිහින' රැකියාවක් සම්බන්ධයෙන් ප්‍රශ්නය වෙන්කර ගත්විට ප්‍රතිඵල මවිත කරවන සුළු විය. සදාචාරාත්මක නොවන ආකාරයට රැකියා ලබාගැනීමට සහභාගීවූවන් වැඩිදෙනෙක් කැමැත්ත දක්වනවා වෙනුවට බහුතරයක් කෙලින්ම එම ලබාගැනීම ප්‍රතික්ෂේප කර ඇත. අවාසනාවකට මෙන් මෙම ප්‍රශ්ණ වාක්‍යයට නගා තිබූ ආකාරය වෙනස් වීම නිසා සංසන්දනයක් කළ නොහැක. කෙසේවූවත් මෙයින් පෙන්වන්නේ ශ්‍රී ලාංකික තරුණයන් 'සිහින' රැකියාව තම සුපිළිපන්භාවයට හානි නොවන සේ ලබාගතයුතු එකක් බව විශ්වාස කිරීමය. සීමිත ප්‍රතිඵල මත නිගමනයන්ට පැමිනීමේ අවදානම ඇතිව, B.6-1 රූපසටහනෙන් දක්වන්නේ ශ්‍රී ලාංකික තරුණයින්ගේ අනාගතය ඉතා සුබ දායක බවය.




රූපසටහන B.6-1: සදාචාරනොවන අයුරින් 'සිහින රැකියාව' ලබාගැනීමට ඇති කැමැත්ත, පදිංචිය අනුව

ප්‍රධාන අනාවරණයන්

# C. පරිසරය සහ සුපිළිපන්නභාවය පිළිබඳ ක්‍රියා

ආශාව සහ බලය පිළිබඳ අපේක්ෂාවන් මත පදනම් වූ දූෂණය ප්‍රබල බලවේගයකි. දූෂණයට එරෙහි සටන අපහසු කාර්යයක් වන අතර පුරවැසි සැමගේ එකමුතුවෙන් කළයුතු දෙයකි. මෙම හේතුව නිසා ශ්‍රී ලංකාවේ සුපිළිපන්නභාවය ප්‍රවර්ධනය කිරීමට සහ දූෂණය නැති කිරීමේ භූමිකාවක් සඳහා මෙම තරුණයින්ගේ ඇති හැකියාව TISL මගින් සොයා බැලීය. මේ සම්බන්ධයෙන් අර්ථාන්විත තොරතුරු ලබාගැනීම සඳහා, දූෂණය නැතිකිරීම සඳහා ඔවුන් ක්‍රියාකරන්නේ නම් දූෂණයට එරෙහිව පුද්ගලිකවම හඬනැගීමට ඉදිරිපත් වන්නේදැයි සහ, දූෂණයට විරුද්ධව නැගීසිටීමට නොහැකිවන හේතු මොනවාදැයි සහභාගීවූවන්ගෙන් අසන ලදී.




රූපසටහන C.1: දූෂණය දුරුකිරීම සඳහා වන තරුණයාගේ භූමිකාව, තරුණයින් සහ වැඩිහිටියන් අතර

සහභාගීවූවන්ගෙන් ගෙන් 56%ක් තරුණයින්ට දූෂණය දුරුකිරීම සඳහා ප්‍රධාන භූමිකාවක් තිබෙන බව සහ තවත් 33%ක් ඔවුන්ට සීමිතවූ හෝ භූමිකාවක් තිබෙන බව පැවසීම ධනාත්මක තත්වයකි. තරුණයින්ට ප්‍රධාන භූමිකාවක් තිබෙන බව වැඩිහිටියන්ට වඩා තරුණයින්ම විශ්වාස කිරීම සිත්ගන්නා සුළුය. ඒ අතර වැඩිහිටියන් බොහෝවිට විශ්වාසකරන්නේ තරුණයින්ට මේ සම්බන්ධයෙන් කිසිවක් කළ නොහැකි බවකි.




රූපසටහන C.2: දූෂණය දුරුකිරීම සඳහා වන තරුණයාගේ භූමිකාව, තරුණයින් සහ වැඩිහිටියන් අතර පදිංචිය අනුව

මෙම දත්තයන් බෙදා වෙන් කළ විට නාගරික සහ ග්‍රාමීය තරුණයින් අතර කැපී පෙනෙන වෙනසක් දක්නට ලැබුණි. නාගරික තරුණයින් දූෂණය නැති කිරීම සඳහා වඩාත් බලගැන් වී ඇති බව පිළිගන්නා අතර තමා මෙහිදී සම්පූර්ණයෙන් බලරහිත යැයි බව පිළිගැනීමට අකමැතිවිය. මෙම තත්ත්වය සාමාන්‍ය පිළිග ැනීම හා සැසඳීමේදී ග්‍රාමීය තරුණයා දූෂණය ඉවසන සහ සදාචාරාත්මක නොවන හැසිරීම්වල යෙදීමේ ප්‍රවණතායක් පවතී. ග්‍රාමීය ප්‍රදේශවල තරුණයින් දූෂණයට එරෙහිවීමට ශක්තියක් නොමැති යයි සිතීමට වඩා ඉඩකඩ ඇති අතර එබැවින් ඔවුන් දූෂණය තම දෛනික ජීවිතයේ අංගයක් ලෙස පිළිගනී. ඒ අනුව ග්‍රාමීය තරුණයින් දූෂණයට එරෙහිව මෙහෙයවීම සඳහා බලගැන්වීමට වැඩි අවධානයක් යෙදිය යුතුය.




රූපසටහන C.3: දූෂණය පැමිණිළි කිරීමට ඇති කැමැත්ත, තරුණයින් සහ වැඩිහිටියන් අතර

දූෂණයට එරෙහිව හඬනැගීමට සහභාගීවූවන්ගේ ඇති කැමැත්ත විමසන පරිදි ප්‍රශ්ණය වෙනස් කළ විට ප්‍රතිඵල වඩාත් සංකීර්ණ විය. තරුණයින් ගෙන් 7%ක් පමණක් දූෂණයට එරෙහිව දැනටමත් හඬනගා ඇත. එමෙන්ම 27%ක් දූෂණයට එරෙහිව හඬනැගීමට කොහෙත්ම සූදානම් නැත. මෙයින් පෙන්වන්නේ අඩු වශයෙන් තරුණයින් ගෙන් 20%ක් තමන්ට වෙනසක් සිදුකිරීමට හැකි වෙතැයි විශ්වාස කරන නමුත් එම වෙනස තමන් විසින්ම කිරීමට කැමැත්තක් නොදැක්වීමය.

වඩාත් සතුටට පත්විය හැකි කරුණ වන්නේ සෑම තරුණයින් තිදෙනෙකුගෙන් කෙනෙක්ම දූෂණයට එරෙහිව හඬනැගීමට කැමැත්තෙන් සිටින අතර එවැනිම වූ සංඛ්‍යාවක් සැමවිටම නොව සමහර විටෙක පමණක් හෝ හඬනැගීමට සූදානම් වීමය. කෙසේනමුත් මෙම ප්‍රතිචාරයන් පිළිබඳව වටහාගත යුත්තේ ශ්‍රී ලාංකික සමාජ සන්ධර්භය තුළය.

කුරිරු යුද්ධයකින් පසු තවමත් ප්‍රතිසාධනය වන ශ්‍රී ලංකාවේ මානව හිමිකම් වාර්තාව පිළිබඳව එක්සත් ජාතීන්ගේ සංවිධානය, හියුමන් රයිට්ස් වොච් ආයතනය (Human Rights Watch) සහ ඉන්ටනැෂනල් ක්‍රයිසිස් ගෲප් (Internationl Crisis Group) සහ තවත් ආයතන ප්‍රශ්ණ කර ඇත[7]. බොහෝ තරුණයින්, විශේෂයෙන්ම

ප්‍රධාන අනාවරණයන්

සුළු වාර්ගික කණ්ඩායම්වලට අයත්වන තරුණයින් දූෂණයට එරෙහි වීමේදී ඔවුන්ගේ අනාගතය පිළිබඳව පමණක් නොව ශාරීරික ආරක්ෂාව පිළිබඳවද සැලකිලිමත් වනවා ඇත. C-4 රූපසටහනෙන් පෙන්වන පරිදි සෑම ශ්‍රී ලාංකික තරුණයින් සිව්දෙනෙකුගෙන් එක් අයෙක් දූෂණයට එරෙහිව හඬ නොනගන්නේ බිය නිසාය.




රූපසටහන C.4: දූෂණයට එරෙහිව කථා නොකිරීමට දෙන ලද හේතු, ස්ත්‍රී පුරුෂභාවය අනුව

කෙසේ නමුත් දූෂණයට එරෙහිව හඬ නොනැගීමට ඇති වඩාත් සාර්ථක හේතුව ලෙස සහභාගීවූවන් විසින් සලකන ලද්දේ එසේ කිරීම ඵල රහිත නිසාය යන්නය. ශ්‍රී ලංකාව වැනි සාමාන්‍ය ප්‍රජාතන්ත්‍රවාදී රටක මෙය ඉතා අර්බුදකාරී ප්‍රතිචාරයකි. දූෂණයට එරෙහිවීම සම්බන්ධයෙන් සිදුකළ හැකි භූමිකාවක් තමන්ට ඇති බව ශ්‍රී ලාංකික තරුණයින්ගෙන් බහුතරය පිළිගන්නා විට මෙම තරුණයින් ගෙන් අඩක් පමණ (45%) සලකන්නේ තම හඬනැගීම ඵල රහිත දෙයක් ලෙසය. ඊට අතිරේකව තවත් තරුණයින් 23% ක් පවසා සිටියේ දූෂණයට එරෙහිව හඬ නැගීම තමන්ගේ වගකීම නොවන බවය. මෙය අවාසනාවන්ත තත්ත්වයකි. මක්නිසාද යත්, දූෂණයට එරෙහිව කථා කිරීමේ වැදගත්කම පිළිබඳව දැනුවත් බවේ අඩුවක් එයින් පිළිබිඹු වන නිසාය. දූෂණය පිළිබඳව පැමිණිලි සිදු කරන ක්‍රමවේදය තරුණයින් ගෙන් 6%ක් නොදන්නා බව පැවසීම ඉහත හෙළිදරව්ව තවදුරටත් සනාථ කරයි.

මෙයින් තහවුරුවන්නේ ශ්‍රී ලාංකික ජීවන සන්ධර්භය තුළ තරුණයින් දූෂණයට එරහිව හඬනැගීමට කැමැත්තක් ඇතත් එය සිදුවන්නේ සමහර කොන්දේසි සම්පූර්ණ වුවහොත් පමණක් යන්නය. පළමුව, එසේ කිරීම ආරක්ෂාසහිත බව ඔවුන්ට හැඟිය යුතුය. දෙවනුව, දූෂණයට එරෙහිව කථාකිරීමේ වැදගත්කම සහ එවැනි ක්‍රියාකාරකම් වලින් සැබෑ ජීවිතයට ඇතිවිය හැකි බලපෑම පිළිබඳව ඔවුන් හොඳින් දැනුම්වත් විය යුතුය.

තරුණයින් දූෂණයට එරෙහිව හඬනැගීම වලක්වන්නේ අධ්‍යාපනයේ සහ දැනුම්වත්බවේ අඩුපාඩුවක් නිසා නම් තරුණයින් දූෂණය පිළිබඳව දැනගන්නේ කෙසේදැයි අවබෝධකර ගැනීම වැදගත්ය. සමීක්ෂණයේ මෙම අවසාන කොටසේදී ශ්‍රී ලංකාවේ දූෂණය හා සම්බන්ධ නීති සහ රෙගුලාසි පිළිබඳව ඔවුන් කොතෙක්දුරට දැනුම්වත්ද යන්න සහ ඔවුන් එම තොරතුරු ලබාගත්තේ කෙසේද යන්න පිළිබඳව සහභාගීවූවන්ගෙන් ප්‍රශ්න කරන ලදී.

බොහෝ සහභාගීවූවන් තම තොරතුරු දැනගෙන ඇත්තේ රූපවාහිනිය (31%), ගුවන් විදුලිය (20%) සහ මුද්‍රිත පුවත් පත් මගින් (17%) හරහා වීම විමතියට කරුණක් නොවේ. එසේවුවද විශේෂයෙන්ම තරුණ සහභාගීවූවන් ජංගම දුරකථන හරහා ද (18%) තොරතුරු දැනගෙන තිබූ අතර එසේ තොරතුරු දැනගත් වැඩිහිටි සහභාගීවූවන් සිටියේ අඩු සංඛ්‍යාවකි (10%). සමාජ ජාලයන් සහ අන්තර්ජාලය තුළ

තරුණයින් කේන්ද්‍රගත වූ සාකච්ඡාවන් නිතර ඇතිවන නමුත් ශ්‍රී ලංකාව තුළ මෙය සත්‍යයක් නොවන බව පර්යේෂණ වලින් පෙනී ගොස් ඇත. සමාජ මාධ්‍යයන් මගින් තොරතුරු ලබාගත් බව පැවසූ තරුණයින් සිටියේ 5%ක් පමණය. සියයට 4ක් අන්තර්ජාල පුවත්පත් මගින්ද 4%ක් සමාජ ජාලයන් මගින්ද තොරතුරු ලබාගෙන තිබුනි. මෙයින් අදහස්වන්නේ ශ්‍රී ලංකාව තුළ දූෂණයට එරෙහි අධ්‍යාපනය සමාජ මාධ්‍යයට සහ අන්තර්ජාලයට එක් කිරීම සඳහා විශාල වැඩ කොටසක් කිරීමට ඉතිරිවී ඇති බවය. කෙසේ වෙතත් ශ්‍රී ලංකාව සීමිත අන්තර්ජාල පහසුකම් සහිත රටක් ලෙස පවතින බවද සටහන් කරගත යුතුය[8].




රූපසටහන C.5: තරුණයින් සහ වැඩිහිටියන් තොරතුරු ලබාගන්නා මූලාශ්‍රයන්




රූපසටහන C.6 තරුණයින් සහ වැඩිහිටියන් අතර ශ්‍රී ලංකාවේ දූෂණය හා සම්බන්ධ නීති හා රෙගුලාසි පිළිබඳව ඇති දැනුම

තරුණයින් විවිධ මූලාශ්‍රයන්ගෙන් තොරතුරු ලබාගන්නා නමුත් එම කිසිදු මූලාශ්‍රයක් තරුණයින්ට ප්‍රමාණවත් තොරතුරු සපයන්නේ නැති බවද පැහැදිලිය. තොරතුරු ලබාදෙන ප්‍රධාන මූලාශ්‍රය වන රූපවාහිනිය නැරඹීමේ පහසුකම් තවමත් ඇත්තේ තරුණයින්ගෙන් 31% කට පමණකි.

දූෂණය හා සම්බන්ධ නීති සහ රෙගුලාසි පිළිබඳව ඔවුන් දන්නා ප්‍රමාණය පිළිබඳව තරුණයින් ගෙන් විමසූ විට තොරතුරු ලබාගැනීමේ දුෂ්කරතාවය හොඳින් පැහැදිලි විය. දූෂණය හා සම්බන්ධ නීති සහ රෙගුලාසි පිළිබඳව 'හොඳින්ම දන්නා' බව පැවසුවේ තරුණයින්ගෙන් 6%ක් පමණකි. සියයට 39 ක් 'තරමක්' දැනසිටි නමුත් තරුණයින්ගෙන් බහුතරය (55%)'ඉතා සුළුවෙන් දන්නා බවහෝ කිසිවක් නොදන්නා' බව පැවසූහ.

සමීක්ෂණයේ අනෙකුත් බොහෝ ප්‍රතිචාරයන් පිළිබඳව සහ-සම්බන්ධතාවයක් ඇතිකර ගැනීමට මෙම තොරතුරු උපකාර වේ. දූෂණය හා සම්බන්ධ නීති හා රෙගුලාසි පිළිබඳව සමහර තරුණයන්ට හොඳ වැටහීමක් ඇති නමුත් තවත් බොහෝ දෙනෙකුට එම වැටහීම නොමැත. එමනිසා, තරුණයින්ගෙන් කිසියම් ප්‍රතිශතයක් තුළ සුපිළිපන්භාවය නොමැති බව සහ ආචාරශීලී නොවන හැසිරීම් පිළිගන්නා බවත් පැවසෙන ප්‍රකාශ වටහාගත යුත්තේ මෙම සාපේක්ෂ වශයෙන් නොදැනුවත් බවේ සන්දර්භය තුළය.

අවාසනාවකට මෙන් අධ්‍යාපන පද්ධතිය මගින් මෙම ගැටලුවට විසඳුමක් ලබාදෙන්නේ නැත. C.7 රූපසටහනෙන් පෙන්වන පරිදි සහභාගීවූවන් ප්‍රාථමික අධ්‍යාපන මට්ටමේ සිට තෘතීයික මට්ටමට යාමේදී දූෂණය හා සම්බන්ධ නීති සහ රෙගුලාසි පිළිබඳව 'කිසිවක් නොදත්' හෝ 'ඉතා අල්ප වශයෙන් දන්නා' සංඛ්‍යාව අඩුවූයේ 7%කින් පමණකි(61% සිට 54% දක්වා). ඒ අතර 'තරමක් දන්නා' සංඛ්‍යාව 7%කින් වැඩිවී ඇති අතර 'හොඳින්ම දන්නා' සංඛ්‍යාවේ වෙනසක් සිදුවී නොමැත. මෙම ප්‍රතිඵල අනුව දූෂණය හා සම්බන්ධ නීති හා රෙගුලාසි පිළිබඳව තරුණයින් දැනුම්වත් කිරීමේ අධ්‍යාපන අවශ්‍යතාවයන් අධ්‍යාපන පද්ධතිය මගින් සපුරන්නේ නොමැති යැයි යන ගැටළුකාරී නිගමනයට එළඹිය යුතුව ඇත. ශ්‍රී ලාංකික තරුණයින්ට දූෂණය සම්බන්ධයෙන් යහපත් අධ්‍යාපනයක් ලබානොදන්නේ නම් දූෂණයට එරෙහි මුහුණට මුහුණලා කරන ක්‍රියාකලාපයන් කෙරෙහි ඔවුන්ගේ අදහස් සහ ආකල්ප වෙනස් කිරීම සඳහා ලැබෙන්නේ ඉතා පටු අවස්ථාවකි.




රූපසටහන C.7: තරුණයින් සහ වැඩිහිටියන් අතර ශ්‍රී ලංකාවේ දූෂණය හා සම්බන්ධ නීති හා රෙගුලාසි පිළිබඳව ඇති දැනුම - අධ්‍යාපන මට්ටම අනුව

වැඩිහිටියන්ට වඩා තරුණයින් දූෂණය හා සම්බන්ධ නීති හා රෙගුලාසි පිළිබඳව දැනුම්වත් බවක් ප්‍රකාශ කිරීම ප්‍රශංසනීයය. දෙපාර්ශවය අතර වෙනස සාමාන්‍යයෙන් කුඩා වන අතර විශේෂයෙන්ම අඩු අධ්‍යාපනයක් ලද වැඩිහිටියන් දූෂණය හා සම්බන්ධ නීති හා රෙගුලාසි පිළිබඳව දැනුම්වත් බවක් නොමැති අය වූහ. එනමුත් තෘතීයික අධ්‍යාපනයත් සමග ප්‍රතිඵල බොහෝ සෙයින් වෙනස් වෙයි. හොඳින් අධ්‍යාපනය ලද පසු දූෂණය හා සම්බන්ධ නීති හා රෙගුලාසි පිළිබඳව දැනුම්වත් වූ වැඩිහිටියන් සංඛ්‍යාව දෙගුණයකටත් වඩා වැඩිවිය. ස්ථිර නිගමනයකට පැමිණීමට මෙම ප්‍රතිඵල ප්‍රමාණවත් නොවන අතර, තෘතීයික අධ්‍යාපනයේ ප්‍රමිතිය පිළිබඳ ගැටලුකාරී ප්‍රවනතාවයක් මෙයින් පෙන්වයි.


MENU

# නිගමන සහ නිර්දේශ

තරුණ්‍යයේ සුපිළිපන්භාවය පිළිබඳ සමීක්ෂණයේ (YIS) අරමුණු දෙකකි: ශ්‍රී ලාංකික තරුණයින්ගේ පුද්ගල සුපිළිපන්භාවය පිළිබඳව වත්මන් පාදකරේඛාව පිහිටුවා ගැනීම සහ සුපිළිපන්භාවය කඩවීම් සහ දූෂණයට එරෙහිව තරුණයින්ගේ ක්‍රියාකාරිත්ව මට්ටම සොයා ගැනීමය. මෙම අරමුණු දෙකම අර්ථාන්විතව සපුරාගත හැකි විය. මෙහි ඉදිරිපත් කර ඇති සමීක්ෂණ සොයාගැනීම් අනුව ශ්‍රී ලාංකික තරුණයින් සුපිළිපන්භාවය අගය කරන නමුත් මෙම වටිනාකම් සිය දෛනික ජීවිතයේදී සාක්ෂාත් කර ගැනීමේදී අපහසුතාවයන්ට මුහුණදීමට සිදුවන බව පෙන්වා දී ඇත. සුපිළිපන්භාවය යනු සටන්කර රැකගැනීමට තරම් සුදුසු මූලික හරවත් වටිනාකමක් ලෙස සලකනවා වෙනුවට දූෂණය සහ සුපිළිපන්භාවය කඩවීම් ඔවුන් ලෝකය දෙස බලන දෘෂ්ඨිය අනුව ඔවුන් තුළ කා වැදී තිබෙන නමැති යථාර්ථයට ශ්‍රී ලාංකික තරුණයින් බහුතරයක් මුහුණ දිය යුතුය.

## A. නිගමන

සමීක්ෂණයේ ප්‍රමුඛ පරාමිතීන් සතර පිළිබඳව මෙහි පහත සාකච්ඡා කර ඇති අතර ඒ එක් එක් පරාමිතිය හා සම්බන්ධ ප්‍රධාන සොයාගැනීම් සහ නිගමනයන් ද සඳහන් කර ඇත. ශෂී සමීක්ෂණයේ අරමුණු ලඟාකර ගැනීමේදී මෙන්ම ගතයුතු ක්‍රියාමාර්ගයන් පිළිබඳ නිර්දේශ ලබාගැනීම සඳහා අවශ්‍ය දැනුම් මූලයක් ඇතිකර ගැනිමටද මෙම තොරතුරු තීරණාත්මක වනු ඇත.

### A.1 සදාචාරය සහ සාරධර්ම - හැසිරීමේ සම්මතයන් පිළිබඳ ප්‍රායෝගික අවබෝධය

දූෂණය කෙරෙහි තරුණයින්ගේ වැටහීම, ආකල්ප සහ වටිනාකම් පිළිබඳ පරාමිතීන් ගැන විපරම් කළ විට නිසැකවම ලැබෙන්නේ විසුළු චිත්‍රයකි. ශ්‍රී ලාංකික තරණයින් සුපිළිපන්භාවය යනු කුමක්දැයි දන්නා අතර තම ජීවිත අලලා සුපිළිපන්භාවය අගය කරති. සුපිළිපන්භාවය වැදගත් බවට ප්‍රතිචාර දක්වන නමුත් සුපිළිපන්භාවයට එල්ලවන විවිධ තහංචි සහ සීමාවන් හමුවේ මෙම ප්‍රතිචාරයන් ඉතා දුර්වල වේ. සුපිළිපන්භාවය පිළිබඳ විවිධ අර්ථකථනයන් ගැන විමසූ විට සැලකිය යුතු අඩු සංඛ්‍යාවක් (12% සිට 20% දක්වා) බොරුකීමෙන්, දූෂණයෙන් සහ නීතිය කඩකිරීමෙන් වැලකීම ඇතුළත්වන පොදු අරථදැක්වීම හා එකඟ නොවෙති. මෙම ප්‍රවනතාවය වඩාත් ප්‍රබල වන්නේ නීතිය කඩකිරීම හා සම්බන්ධයෙනි. නීතිය කඩකිරීම කෙනෙකුගේ පුද්ගල සුපිළිපන්භාවය බිඳ ගැනීමක් නොවන බව සෑම ශ්‍රී ලාංකික තරුණයින් පස් දෙනෙකුගෙන්ම එක් අයෙක් විශ්වාස කරති.

'සුපිළිපන් පුද්ගලයෙකු' සතුවිය යුතු ගුණාංග පිළිබඳව ශ්‍රී ලාංකික තරුණයින් තුළ ඇති වැටහීම ද නම්‍යශීලී බව පෙනී යයි. නොකර සිටීමෙන් පාඩු සිදුවන අවස්ථාවලදී 'සුපිළිපන් පුද්ගලයා' බොරුකීම හෝ වංචාව සිදුකරනු බවට ශ්‍රී ලාංකික තරුණයින් ගෙන් අඩක් පමණ විශ්වාස කරති. පරිපූර්ණ පුද්ගලයා තම පවුලේ සමගිය බොරුකීමට, වංචාවට සහ නිතිය කැඩීමට වඩා ඉහලින් තබා සලකන බව ඊටත් වඩා වැඩි තරුණයින් සංඛ්‍යාවකගේ විශ්වාසය විය. (A.4-1,2,3,4 රූපසටහන්) අවසානයේදී 'සුපිළිපන් පුද්ගලයා' සුළු පරිමාන දූෂණවල යෙදෙන්නට කැමති කෙනෙකු යැයි ශ්‍රී ලාංකික තරුණයින් ගෙන් 67%ක් පිළිගනිති.

## A.2 ප්‍රතිපත්ති - හරි වැරදි පිළිබඳ වෙනස වටහා ගැනීමට ඇති හැකියාව

මූල්‍යමය සාර්ථකත්වය සහ උදාර ජීවිතයක් ගතකිරීම සංසන්දනය කරන ලෙස ඉල්ලා සිටි විට ශ්‍රී ලංකාවේදී සාර්ථක පුද්ගලයකු ඇති පීඩනය පරිපූර්ණ ප්‍රතිපත්තීන් අභිබවා යන බව පැහැදිලිය. සුපිළිපන් ජීවිතයක් ගත කිරීම ඉතා වැදගත් යයි තරුණයින්ගෙන් 50%කට ආසන්න ප්‍රමාණයක් විශ්වාසකළ අතර වත්කම්වල සහ සුපිළිපන්නභාවයේ සමබරතාවයක් පැවතීම සත්‍ය වශයෙන්ම වැදගත් අරමුණක් බව බහුතරයකගේ දැක්ම විය. මීට අමතරව ශ්‍රී ලාංකික තරුණයින් පස්දෙනෙකුගෙන් එක් අයෙක් සුපිළිපන්භාවයට වඩා වත්කම අගය කරති. මෙම ප්‍රතිඵල තරුණයින් විසින්ම සුපිළිපන්භාවය සඳහා ප්‍රකාශකළ වටිනාකම් සමග කෙලින්ම පරස්පරතාවයක් දක්වයි.

එක්ව ගත් කළ පෙනීයන්නේ ශ්‍රී ලාංකික තරුණයා සුපිළිපන්නභාවයේ වැදගත්කම හඳුනාගෙන ඇති නමුත් සුපිළිපන්න ජීවිතයක් ගතකිරීම යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි සැමවිටම වටහාගෙන නොමැති බවය. සුපිළිපන්භාවය සෙලවිය නොහැකි ප්‍රතිපත්තියක් ලෙස සැමවිටම සළකා නොමැති අතර එය දේශිය සම්ප්‍රදායන්ට සහ පවතින සැබෑ අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන නම්‍යශීලී සංකල්පයක් ලෙස සලකා ඇත. ඔවුන්ගේ සැබෑ ජීවිතවලදී සමහර වියදම් සහ සබඳතා සුපිළිපන්භාවයට වඩා වැදගත් යයි සළකන ශ්‍රී ලාංකික තරුණයින් වංක ගනුදෙනුවල යෙදෙමින්ම ඔවුන්ගේ සුපිළිපන්භාවය රැකගත හැකියයි විශ්වාස කරයි. කෙසේනමුත් ශ්‍රී ලංකාවේ සීඝ්‍ර ලෙස ඉහල යන අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය සහ ඉන්ධන මිල හා වැඩිවන ඇතිනැති පරතරය හමුවේ දුගීබව ප්‍රබල අවධානයක් යොමුවිය යුතු සාධකයක් බව සටහන් කළ යුතුය. එමනිසා බොහෝ තරුණයින් සුපිළිපන්භාවය පරදුවට තබා වත්කම් කෙරෙහි උනන්දුවීමේ අවශ්‍යතාවයක් දකිති.

තරුණියන් සුපිළිපන්භාවය කෙරෙහි වැඩි කැපවීමක් ඇති බවද කැපවීම දුර්වලම වූයේ ග්‍රාමීය තරුණයින් අතර බවද ශෂී සමීක්ෂණයෙන් පෙනී ගොස් ඇත. මෙම තත්වය දත්තයන් ගණනාවකින්ම තහවුරු වූ අතර එයින් අදහස් වන්නේ නාගරික තරුණියන්ට සමාජ වෙනස්කම් සිදු කිරීමේ පුරෝගාමීන් වීමේ හැකියාව ඇති බවය. එමෙන්ම ග්‍රාමීය තරුණයින් විශේෂයෙන්ම ග්‍රාමීය පිරිමින් සුපිළිපන්භාවය පිළිබඳ අධ්‍යාපනය ලබාදීමේ සහ ප්‍රවර්ධනයේ මූලික ඉලක්ක කණ්ඩායම් විය යුතුය. මෙම වෙනස්කම් වලට බලපාන හේතු හඳුනා ගැනීම අපහසුය. ස්ත්‍රීපුරුෂභාවය අතර ඇති වෙනස්කම් විවිධ අධ්‍යාපන මට්ටම් හරහාද නොවෙනස්ව පවතින අතර නාගරික සහ ග්‍රාමීය බෙදීම පෙන්වා දෙන්නේ මෙම පරතරයන් ශ්‍රී ලාංකික සංස්කෘතිය සමග මුල් බැසගත් ඒවා බවය.

නාගරික සහ ග්‍රාමීය වෙනස්කම් වඩාත් සංකීර්ණය. සමීක්ෂණයෙන් පෙන්වා දෙන්නේ ග්‍රාමීය තරුණයින් නිරතුරුවම දූෂණය හා ගැටෙන අතර සාම්ප්‍රදායිකවම ඥාති සංග්‍රහය පවතින සමාජ අන්තර් සබඳතා සමග ජීවත්වීමට ඔවුන්ට සිදු වී ඇති බවය. පරිපූර්ණ පුද්ගලයන්ට ලැබෙන අවස්ථා පිළිබඳව ග්‍රාමීය තරුණයින්ට දක්නට ලැබෙන්නේ අඩුවශයෙන් වන අතර ඔවුන් තම දෛනික ජීවිතයේ කොටසක් ලෙස ආචාර ධර්මයන්ට පටහැනි කරුණු පිළිගැනීමට සිදුවේ. මෙම හේතූන් නිසා ග්‍රාමීය තරුණයන් අඩු සුපිළිපන්භාවයක් ඇති පිරිසක් බවට පත් නොවන නමුත් සුපිළිපන්භාවයට වඩාත් ප්‍රතිවාදී වන ජීවන ක්‍රමයකට ඔවුන්ගේ වටිනාකම් සහ හැසිරීම් බලහත්කාරයෙන් අනුගත කර ගැනීමට ඔවුන්ට සිදුවී ඇත.

## A.3 නීතිගරුක වීම - නීතියට අනුකූලවන ප්‍රමාණය

සුපිළිපන්භාවය අර්ථ දැක්වීමේදී නීතිය කඩ කිරීමට වඩා බොරුව, වංචාව සහ දූෂණය සුපිළිපන්භාවයට එරෙහි ක්‍රියාවන් ලෙස තරුණයින් හඳුනාගන්නා ලදී. මෙම සොයාගැනීමෙන් පෙන්වන්නේ ශ්‍රී ලාංකික තරුණයින් නීතිය කෙරෙහි දක්වන පැහැදිලි ප්‍රතිරෝධයයි. නිදසුනක් ලෙස තරුණයින් රාජ්‍ය නිලධාරියෙකුට හෝ පොලිස් නිලධාරියෙකුට අල්ලසක් දීමට කැමැත්ත දැක්විය හැකි නමුත් ගුරුවරයෙකු විෂයයෙහි එසේ නොවේ. විශේෂයෙන් පොලීසිය කෙරෙහි විශ්වාසයක් නොමැතිබව මෙවැනි ආකල්පයන් ඇතිවන මූලය ලෙස දැක්විය හැකිය.

පසුගිය වසර තුළදී සැබෑ ලෙසම දූෂණයට එරෙහිව කටයුතු කරන ලද්දේ තරුණයින් සුළු සංඛ්‍යාවක් වන නමුත් සමස්ථයක් ලෙස ශ්‍රී ලාංකික තරුණයින් දූෂණයට එරෙහිවීම සඳහා විශ්මිත කැමැත්තක් දැක්වීය. මෙයින් අඟවන්නේ මෙම තරුණයන්ට සුපිළිපන්භාවය කෙරෙහි කැපවීම සඳහා සහ දූෂණයට එරෙහිවීම සඳහා අවශ්‍ය අධ්‍යාපනය ලබාදිය යුතු බවය.

පිරිමින් දූෂිත ක්‍රියාවන්හි නියැලීම සැලකිය යුතු ලෙස වැඩි බව සනිටුහන් කර ගැනීමද වැදගත්ය. සුපිළිපන්භාවය පිළිබඳ වටිනාකම් වලදී ස්ත්‍රීපුරුෂ විෂමතාවයන් ගේ ප්‍රතිඵලයක් ලෙස මෙය සිදුවී දැයි පැවසීම අපහසුය. තරුණයින් දූෂණය සඳහා වඩාත් පෙළඹවීමට ලක්වන අතර එම නිසා තම ජීවිතයේ වටිනාකම් පද්ධතියතුළ දූෂණය බලහත්කාරයෙන් පිළිගැනීමට ඔවුන්ට සිදු විය හැකිය. මෙම ගැටළුකාරී ප්‍රවනතාවයට හේතු වටහාගැනීමට වැඩිදුර පර්යේෂණ සිදුකළ යුතුය. මෙම හේතුව නොසලකා සුපිළිපන්භාවය පිළිබඳව ඔවුන්ගේ අවබෝධය වැඩිකිරීමට සහ දූෂණයට ප්‍රතිරෝධී වීමේ හැකියාව වර්ධනය කිරීම සඳහා තරුණයින් ඉලක්ක කරගත යුතු බව පැහැදිලිය.

## A.4 දූෂණයට ප්‍රතිරෝධී වීම - දූෂිත පුරුදු වෙනස් කිරීමේ හැකියාව

දූෂණය වැලැක්වීම සඳහා තම පරපුර විසින් සිදුකළ යුතු භූමිකාවක් ඇති බව තරුණයින් බහුතරයක් විශ්වාස කරති. මෙය අවධාරණය කරගත යුතු සාධනීය නිගමනයකි. කෙසේවෙතත් ශ්‍රී ලාංකික තරුණයින් ගෙන් 6%ක් පමණක් සැබෑ ලෙසම දූෂණයට එරෙහිව හඬනැගීමෙන් පැහැදිලි වන්නේ තරුණයින් දූෂණය මැඩලීමට සැලකිය යුතු කාර්යභාරයක් ප්‍රායෝගිකව ඉටු නොකරන බවය. එනමුත් සෑමවිටම හෝ සමහර අවස්ථාවලදී දූෂණයට එරෙහිව හඬනැගීමට තරුණයින් බහුතරයක් කැමැත්තෙන් සිටී. සැබෑ ක්‍රියාව සහ සිතුවිලි අතර ඇති මෙම පරස්පරයට හේතු පෞද්ගලික මෙන්ම ව්‍යුහාත්මකය.

සාර්ථකත්වයට හොඳම මාවත දූෂණය ලෙස දකින තරුණයින් එම යථා තත්වයට අභියෝගකිරීමට කැමැත්තක් නොදක්වනු ඇත. අවාසනාවකට මෙන් සාර්ථකත්වයට ඇති හොඳම මාවත හෝ එකම මාවත වංචාව ලෙස ශ්‍රී ලාංකික තරුණයින් බොහොමයක් දකිති. මෙම විශ්වාසය ග්‍රාමීය තරුණයින් අතර මෙන්ම අධ්‍යාපනයක් ලැබූවන් අතරද බහුලය. දූෂණය තුළින් සාර්ථකත්වය පෙන්වන්නන් සමග බොහෝවිට ගැටෙන කණ්ඩායම් වන්නේ මොවුන් බව මෙයින් පිළිබිඹු වේ.

ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවා සපයන්නන් පිළිබඳව තරුණයින් බහුතරයක් තුළ ඇති පහත් මතය මෙම නිගමනය සැලකියයුතු පරිදි ශක්තිමත් කරයි. පොලීසිය සහ ප්‍රාදේශීය පරිපාලනය යන දෙඅංශයම ඉහල මට්ටමක දූෂණයක් සහ අඩු මහජන විශ්වාසයක් ලබාසිටින බව ඉස්මතු කර තිබුණි. මෙම ආයතන වලින් ඕනෑම එකක් සමග නිතර ඇතිවන අන්තර් ක්‍රියාවන් නිසා තරුණයින් තුළ සුපිළිපන්භාවය පවත්වා ගැනීමේ සහ ප්‍රවර්ධනය කිරීමේ හැකියාව අඩුවිය හැකිය. අනෙක් අතට, රාජ්‍ය නිලධාරීන් සමග අන්තර් ක්‍රියා පවත්වන කණ්ඩායම් තුළ සුපිළිපන්භාවය සඳහා නම්‍යශීලී සහ විවිධ වූ කැපවීමක් පවතින බව නිගමනයන් පෙන්වාදෙයි.

ව්‍යුහාත්මක වශයෙන් සෑම තරුණයින් තිදෙනෙකුගෙන් කෙනෙක් ඔවුන්ට දූෂණයට එරෙහිව කටයුතු කිරීමට ශක්තියක් නොමැති බවක් හඟවයි. දූෂණයට එරෙහිව හඬ නැගීම තම වගකීම නොවන බව තවත් තරුණයින් 25% කගේ අදහසය. කිසියම් මට්ටමක දුරස්ථ භාවයක් සහ අසම්බන්ධතාවයක් අඟවන මෙම විශ්වාසයන් ඉතා අර්බුදකාරී වන අතර එය තරුණයින් දූෂණයට එරෙහි වීමේ ප්‍රයත්නයන් මොටකරන්නක් විය හැකිය. කෙසේ නමුදු මෙම ගැටලු සඳහා සාපේක්ෂ වශයෙන් සරල විසඳුම්ද ඇත.

# B. නිර්දේශ

YIS සමීක්ෂණය දැනුම උත්පාදනය කළ මෙවලමකට වඩා වැඩි දෙයකි. සුපිළිපන්භාවය සඳහා සහ දූෂණයට එරෙහිව සටන් කිරීම සඳහා තරුණයින් බලගැන්වීමේ ජාත්‍යන්තරය හා ඒකාබද්ධ පුළුල් ක්‍රියාන්විතයක පළමු පියවර ද මෙයයි. එමනිසා TISL ආයතනය,මෙම වාර්තාවෙන් තම තමන්ගේ නිගමනයන්ට එළඹීමට මෙය පරිශීලනය කරන්නන් දිරිගන්වන අතර ශ්‍රී ලාංකික තරුණයින් බලගැන්වීම සඳහා පහත සඳහන් නිර්දේශයන්  ඉදිරිපත් කරයි. මෙම නිර්දේශයන් සපුරාගැනීම සඳහා අදාල සියල්ලන් සමග TISL ආයතනය කටයුතුකරනු ඇති අතර තාරුණ්‍යයේ සුපිළිපන්භාවය පිළිබඳව කැපවන සියල්ලන්ටම මෙම අරගලයේදී අප හා එක්වන ලෙස ඇරයුම් කරනු ලැබේ.

## B.1 දූෂණය සහ සුපිළිපන්භාවය පිළිබඳ විමර්ෂණ

ශ්‍රී ලංකාවේ තරුණයින්ගේ සුපිළිපන්භාවය සහ දූෂණය පිළිබඳව වැදගත් මූලික සමීක්ෂණ තොරතුරු YIS සමීක්ෂණය මගින් සපයනු ලැබීය. කෙසේනමුදු මෙම තොරතුරු නව ගැටලු මතුකර ඇති අතර එකී ගැටළු වලට පිළිතුරු සෙවීම මගින් සුපිළිපන්භාවය ප්‍රවර්ධනය කිරීමට TISL ආයතනයට හැකිවනු ඇත. සමීක්ෂණයට සහභාගීවූ තරුණයින්ගේ ග්‍රාමීය/ නාගරික බෙදීමට හේතු සාධක, සුපිළිපන්භාවය පිළිබඳව වැදගත් තොරතුරු සමග තරුණයින් ඇමතීමේ වඩාත් ඵලදායක ක්‍රම මොනවාද යන්න සහ තරුණියන් සුපිළිපන්භාවය සඳහා වැඩි කැපවීමක් පෙන්වීමට හේතු අවබෝධකර ගැනීම සඳහා විශේෂයෙන්ම වැඩිදුර තොරතුරු අවශ්‍යවේ.

මෙම පර්යේෂණ සඳහා අතිරේක සමීක්ෂණයන් අවශ්‍ය නොවේ. ඒ වෙනුවට තම මූලික දැණුම දියුණුකර ගැනීම සඳහා TISL ආයතනය තුන් ආකාර ප්‍රවේශයක් ක්‍රියාත්මක කරනු ඇත. පළමුව, පර්යේෂකයින් දැනට TISL ආයතනය සතු ජාතික සුපිළිපන්නභාවයේ පද්ධති ඇගයීම සහ පුරවැසි වාර්තාපත් සමීක්ෂණ වාර්තා ඇතුළු ප්‍රකාශන පරිශීලනය කර එම ප්‍රතිඵල YIS සමීක්ෂණ ප්‍රතිඵල සමග සසඳනු ඇත. දෙවනුව, TISL ආයතනය දැනට සිටින සහභාගීවූවන් සහ සහකරුවන් හා එක්ව අදාල කණ්ඩායම් සමග අවිධිමත් සම්මුඛ සාකච්ඡා පවත්වා සමීක්ෂණයේ ප්‍රතිඵල පිළිබඳ විශේෂිත ප්‍රශ්නවලට පිළිතුරු ලබාගැනීමට කටයුතු කෙරේ. තුන්වෙනුව, අනෙකුත් තරුණ ක්‍රියාකාරිත්ව වැඩසටහන්වල මෙන් TISL ආයතනය ශක්තිමත් අධීක්ෂණය කිරීමේ සහ ඇගයීමේ ක්‍රියාවලියක් පවත්වාගෙන යනු ඇත. මෙම ක්‍රියාවලියන් තුළින් ඉහත සඳහන් ප්‍රශ්නවලට පිලිතුරු ලෙස අගනා තොරතුරු දත්තයන් ජනනය කරනු ඇත. මෙම මෙවලම් තුන ඒකාබද්ධ වූවිට අවශ්‍ය දැනුම් පරතරයන් පුරවා ගැනීමට හැකිවනු ඇති අතර ඒ අනුව තරුණයින් අතර සාර්ථකව සුපිළිපන්භාවය ප්‍රවර්ධනය කිරීමට TISL ආයතනයට හැකිවනු ඇත.

## B.2 පාසැල් අධ්‍යාපනය වැඩිදියුණු කිරීම

තරුණයින් ප්‍රාථමික අධ්‍යාපන මට්ටම්වල සිට තෘතීයික අධ්‍යාපන මට්ටම් දක්වා යන විට දූෂණය පිළිබඳ නීති හා රෙගුලාසි පිළිබඳ ඔවුන්ගේ සාපේක්ෂ දැනුම දියුණු නොවන බව සමීක්ෂණයෙන් හෙළි විය. මෙයින් පෙන්වන්නේ දූෂණය සහ සුපිළිපන්භාවය පිළිබඳ තීරණාත්මක දැනුම පාසැල් පද්ධතිය තුළින් තරුණයින්ට නොලැබෙන බවය. ඒ අනුව පුද්ගලිකව ගුරුවරුන් සමගත් අදාල අමාත්‍යවරුන් සමගත් රාජ්‍ය නිලධාරීන් සමගත් මෙම උපදෙස් ලබාදීමේ ප්‍රමිතීන් දියුණු කිරීමටත් ඒ සඳහා අවශ්‍ය අධ්‍යාපනික භෞතික සම්පත් ලබාදීමටත් TISL ආයතනය කටයුතු කරනු ඇත.මෙම සම්පත් අතර ඉගෙනීමට සහ අවබෝධයට සුදුසු ලෙස සකස් වූ ආචාරධර්ම, වටිනාකම් සහ සදාචාරාත්මක හැසිරීම  පිළිබඳව කියවීම සඳහා පොත් සහ ප්‍රකාශන ඇතුළත් විය හැකිය.

දුගී බව ඉහළ මට්ටමක පැවතියද ශ්‍රී ලංකාව ශක්තිමත් අධ්‍යාපන පද්ධතියක් පවත්වාගෙන යන අතර ඉතාම ඉහළ සාක්ෂරතා මට්ටම් පිළිබඳව උදම් අනන රටකි. එම නිසා මෙම ක්‍රියාවලියේදී පාසැල්වලට

සහ ගුරුවරුන්ට ඵලදායී සහකරුවන් විය හැකිය. අවශය සම්පත් සහ පුහුණුව ලබාදීම මගින් දූෂණයට එරෙහිව සටන්කිරීමට තරුණයින් බලගැන්වීම සඳහා මෙම ශක්තිමත් අධ්‍යාපන පද්ධතිය භාවිතා කිරීමට TISL ආයතනය අපේක්ෂා කරයි.

## B.3 පාසැලෙන් පසු අධ්‍යාපනය සහ දැනුම වර්ධනය

පාසැල අධ්‍යාපනයේ වැදගත් අංශයක් වන අතර විධිමත් පන්ති කාමරයෙන් බැහැර වූ පරිසරයක් තුළ තරුණයින් හා කටයුතු කිරීමේ මහඟු අවස්ථාවන් පවතින බව TISL ආයතනයට පෙනී ගොස් ඇත. අභිප්‍රේරණය වූ තරුණයින්ට සුපිළිපන්භාවය සහ දූෂණය ගැන ගැඹුරු අවබෝධයක් ලබාගැනීමටත් වෙනසක් ඇතිකිරීමේ නියමුවන් වීමටත් අවස්ථාවක් ඇත. TISL ආයතනයේ සුපිළිපන් තාරුණ්‍ය වැඩසටහන් මගින් දූෂණයට එරෙහි සටනේදී සැබෑ නායකයින් වීමට අවශ්‍ය මෙවලම් ලබාගැනීමට තරුණයින්ට අවස්ථාව ලැබේ. මෙම අවස්ථාව කොළඹින් බැහැර තරුණයින්ටද ලබාදීමට TISL ආයතනය අපේක්ෂා කරයි. සමීක්ෂණයේදී පෙනීගිය පරිදි ග්‍රාමීය තරුණයින් මෙහි ඉලක්ක කණ්ඩායම විය යුතුය. එමනිසා තරුණයින් සඳහා විෂය බාහිර ක්‍රියාකාරකම් සහ සම්පත් ලබාදීමට සිය ග්‍රාමීය සහකරුවන් සමග එක්ව TISL ආයතනය කටයුතු කරනු ඇත.

## B.4 ආදර්ශන ශක්තියකින් යුක්තව දූෂණය අධීක්ෂණය සඳහා තරුණයින් දිරිගැන්වීම

YIS සමීක්ෂණයට අනුව තරුණයින් බහුතරයක් දූෂණයට එරෙහිව හඬ නැගීමට කැමැත්තක් දැක්වූවද ඒ සඳහා සැබෑ ලෙසම කටයුතු කරන්නේ සුළු පිරිසකි. දූෂණයට එරෙහිව සටන්කිරීමට තරුණයින්ට ඇති අවස්ථා වැඩිකිරීමට TISL ආයතනය ඔවුන් හා එක්ව කටයුතු කරන අතර ඔවුන් එම කාර්යයයේ නියැලෙන විට ඒ සඳහා සහයෝගය ද ලබාදෙනු ඇත. නවීන සමාජ මාධ්‍ය මෙවලම් භාවිතාකරමින් සහ දූෂණයට ගොදුරුවූවන්ට සහ දූෂණයේ සාක්ෂිකරුවන්ට නෛතික උපදෙස් ලබාදෙන මධ්‍යස්ථානයක් වන 'සුසැරි සෙවන' (Shelter for Integrity) මධ්‍යස්ථානය හරහා තරුණයින්ට කෙලින්ම උපකාර කිරීමට TISL ආයතනය අපේක්ෂා කරයි. එමෙන්ම TISL ආයතනය තරුණයින්ට තම අදහස් ප්‍රකාශකිරීම සඳහා වේදිකාවක් සකස් කර දීමටත් දූෂණයට එරෙහිව සටන්කිරීම සඳහා ආධාර කිරීමටත් ඉදිරිපත් වනු ඇත.

කෙසේවුවද තරුණයින් දූෂණයට එරෙහිව තම හඬ නැගීමට දැනගත යුතු අතර ඔවුන්ගේ එම ක්‍රියාවන් වලින් බලපෑමක් ඇති කළ හැකි බවට හැඟීමක් සහ විශ්වාසයක් ඔවුන්ට ඇතිවිය යුතුය. එම නිසා දූෂණ ක්‍රියා පිළිබඳව පැමිණිලි කළ යුතු ක්‍රමවේදයන් පිළිබඳ දැනුම වර්ධනය කිරීමටත් දූෂණය මන්තුකරණය කිරීමට සහ දූෂණයට එරෙහි ක්‍රියාකාරකම්වල බලපෑම පිළිබඳව අධ්‍යාපනයක් ලබාදීමටත් TISL ආයතනය කටයුතු කරනු ඇත. තරුණයින් සඳහා ඇති ජාත්‍යන්තර නිම්වළලු පුළුල්කිරීම සඳහා YIS සමීක්ෂණයත් සමග ඇති කරගත් ජාත්‍යන්තර ජාලයන් උනන්දුකිරීමටද TISL ආයතනය කටයුතු කරනු ඇත. මෙමගින් දූෂණයට එරෙහි සටනේ ජාත්‍යන්තර පරිශ්‍රමයේ කොටසක් ලෙස තරුණයින් කටයුතු කරනු ඇති අතර අනෙකුත් රටවල අත්දැකීම්වලින් සහ සාර්ථක ක්‍රියාවලීන් ගෙන් පාඩම් ඉගෙනගැනීමටද ඔවුන්ට හැකිවනු ඇත.

## B.5 **බහු - මාධ්‍ය සහ සමාජ මාධ්‍ය තුළින් සුපිළිපන්නභාවයේ වටිනාකම් ප්‍රවර්ධනය කිරීම**

ශ්‍රී ලාංකික තරුණයින් සුපිළිපන්භාවය අගය කරන නමුත් මෙම ඇගයීම් නම්‍යශීලී වන බවත් සමහරවිට අඩු දැනුවත්බවක් දක්වන බවත් පැහැදිලි වේ. එමනිසා සුපිළිපන්නභාවයේ අර්ථාන්විත වටිනාකම් ප්‍රවර්ධනය කිරීම සඳහා TISL ආයතනය මාධ්‍ය ප්‍රචාරණයන් දියත්කරනු ඇත. බොහෝ ශිෂ්‍යයින් තම තොරතුරු ලබාගන්නේ රූපවාහිනියෙන් සහ ගුවන්විදුලියෙන් වන අතර ජංගම දුරකථන මගින් තොරතුරු ලබාගන්නා සංඛ්‍යාව වැඩිවෙමින් පවතී. සුපිළිපන්භාවය පිළිබඳව ශක්තිමත් පණිවුඩ සමග තරුණයන් කරා යාමට TISL ආයතනය මෙම මාධ්‍යයන් විශේෂයෙන්ම ජංගම දුරකථන සහ ගුවන්විදුලිය භාවිතා කරනු ඇත. සුපිළිපන්භාවය පිළිබඳ වටිනාකම් ප්‍රවර්ධනය කිරීම මගින් මෙම වටිනාකම් ශක්තිමත් කිරීමට සහ පැහැදිලි කර ගැනීමට තැත්කරන අතරමචීවා පිළිබඳ ආදර්ශ කැපවීම් ගොඩනැගෙනු ඇත.

## B.6 - **තරුණයින් සඳහා ආදර්ශවත් චරිත**

ශ්‍රී ලාංකික තරුණයින් බොහෝදෙනෙකු සිතන්නේ බොරුව සහ වංචාව සාර්ථකත්වයට අවශ්‍ය මාර්ගයන් බවයි YIS සමීක්ෂණයෙන් පෙන්වා දී ඇත. සුපිළිපන්භාවය පිළිබඳව නම්‍යශීලි සංකල්පයන් ඇති අයට ගරුකිරීමටද තරුණයින් කැමැත්තක් දක්වයි. ප්‍රායෝගිකව අල්ලස් දීම සිදුකරන තරුණයින් සංඛ්‍යාව අඩු වන නමුත් අල්ලසක් දීම වරදක් නොවන ක්‍රියාවක් ලෙස බොහෝ තරුණයෝ දකිති.

තරුණයින් අනුන් අනුගමනය කිරීමට පෙළෙඹෙන අතර ඔවුන්ට මග පෙන්වන උපදේශකයන් සහ වීරවරයන් සිටිති. මෙම ආදර්ශවත් චරිත මගින් තරුණයින්ගේ ආකල්ප සහ වටිනාකම් මූලිකවශයෙන් වෙනස්කළ හැකිය. එමනිසා සැබෑ සුපිළිපන්භාවය පෙන්වන සහ මෙම වැරදි ආකල්ප බිඳහෙලන ආදර්ශවත් චරිත ශ්‍රී ලාංකික තරුණයින්ට අවශ්‍යය. මෙම ප්‍රයත්නයේදී අතීතයේ සිටි සහ වර්තමානයේ සිටින ප්‍රසිද්ධ චරිත සහ සුපිළිපන්භාවය තුළින් සුවිශේෂී තත්ත්වයන් ලබාගත් සාමාන්‍ය ශ්‍රී ලාංකිකයන් ඇතුළත්විය යුතුය. විශිෂ්ඨ ශ්‍රී ලාංකිකයින්ට ප්‍රණාමය පුදකරන ජාතික සුපිළිපන් සම්මානයක් TISL ආයතනය දැනටමත් ක්‍රියාත්මක කරයි. සැබෑ පරිපූර්ණ පුද්ගලයෙකු ලෙසින් සාර්ථකත්වයට පත්වීමට ශ්‍රී ලංකාව තුළ අවස්ථාව තිබෙන බව තරුණයින් දැනගත යුතුය. මේනිසා TISL ආයතනය ව්‍යාපාරික ලෝකයේ, රාජ්‍ය අංශයේ සහ කලා ක්ෂේත්‍රයේ අය අතුරින් අතිවිශිෂ්ට නායකයින් සොයා ඔවුනට ප්‍රසිද්ධියේ උපහාර දක්වනු ලබයි.

TISL ආයතනයේ අධ්‍යාපනික සහ ක්‍රියාකාරිත්ව වැඩසටහන් වලට සහභාගීවීමට තෝරාගන්නා තරුණයින් සඳහා TISL ආයතනයේ කාර්යමණ්ඩලය පුද්ගලික මට්ටමෙන් තනි තනිව උපදේශන සහාය ලබා දෙනු ඇත. මෙම ක්‍රියාව මගින් ලබාගත හැක්කේ ඉතා පටු බලපෑමක් වුවද එමගින් ගැඹුරු බලපෑමක් ලැබීමේ හැකියාවක්ද ඇත. දැනුමෙන් සහ මගපෙන්වීමෙන් තරුණයින් බලගැන්වීම මගින් ශ්‍රී ලාංකික තරුණයින් අතුරින් වෙනසක් ඇති කිරීමට හැකියාව ඇති ශක්තිමත් කණ්ඩායම් බිහිකර විය හැකිය.

## B.7 **තරුණියන්ට විශේෂිතවූ ක්‍රියාවන්**

TISL ආයතනය තරුණියන් ඉලක්ක කරගත් අධ්‍යාපන ක්‍රියාකාරකම් සිදුකරන්නේ ඔවුන් සමාජයේ වෙනස්කම් අති කරන කණ්ඩායමක් ලෙස බලගැන්විමටය. YIS සමීක්ෂණයට අනුව ශ්‍රී ලාංකික තරුණියන්ගේ සුපිළිපන්භාවය කෙරෙහි සහ දූෂණයට එරෙහිවීම කෙරෙහි ශක්තිමත් කැපවීමක් ඇති බව පෙන්වා ඇත. TISL ආයතනය මෙම තරුණියන්ට අධ්‍යාපනය, සහයෝගය සහ උපදේශනය ලබාදීමෙන් ඔවුන්ට අනුග්‍රහය දක්වනු ඇත.

ශ්‍රී ලාංකික සමාජයේ කාන්තාව නිතර කොන්වූ තත්ත්වයක පසුවේ. එනමුත් පවුලේ සහ පොදු සමාජයේ වැදගත් භූමිකාවක්ද ඇය ඉටු කරයි. විශේෂිතවූ තරුණියන් සමග ක්‍රියාකරමින් සුපිළිපන්භාවය ගොඩ නගනු සඳහාත් දූෂණයට එරෙහිවත් සටන් කරන නව කාන්තා නායකත්ව පරපුරක් ඇති කිරීමට TISL ආයතනය කටයුතු කරනු ඇත.

## B.8 ඉලක්ක ගත ග්‍රාමීය දූෂණය

ඉහත දක්වන ලද නිර්දේශයන් ගේ සන්ධර්භය තුළ TISL ආයතනය විශේෂයෙන්ම ග්‍රාමීය ප්‍රදේශ ඉලක්ක කරනු ඇත. ශ්‍රී ලංකාවට ලැබෙන ආධාර සහ සහයෝගයන් බොහෝවිට අගනුවරට ඒකාග්‍ර වී ඇත. ආධාර ග්‍රාමීය ජනතාව වෙත ලඟාවන විට ඒවා බොහෝවිට ගැටුම් සහ ස්වාභාවික විපත්වලින් තම ජීවිත පීඩාවන්ට පත්වූවන් සඳහා ලබාදිය යුතු හදිසි ආධාර සඳහා වෙන්වේ. ග්‍රමීය සමාජයන් සඳහා කෙරෙන මෙම සීමිත කටයුතු වලින් ඔබ්බට යන මෙම ව්‍යාපෘතිය ජන වර්ගය හෝ පදිංචිය නොසලකා සමස්ත ශ්‍රී ලාංකික තරුණයින් කෙරෙහි බලපෑමක් ඇතිකිරීම සඳහා ක්‍රියාත්මකවන ව්‍යාපෘතියකි.

තොරතුරු ලබාගැනීමේ හැකියාව, ආර්ථික අවස්ථා, සෞඛ්‍යය සේවා සහ තවත් පහසුකම් අතින් ශ්‍රී ලාංකික ග්‍රාමීය ජනතාව තවදුරටත් කොන්වී සිටී. TISL ආයතනය ග්‍රාමීය තරුණයින් මුහුණපා ඇති මෙම අභියෝග හඳුනාගෙන සිටින අතර තම තරුණ වැඩසටහන් සඳහා මෙම තරුණයින්ව ඇතුළත්කර ගැනීමට සහ ඔවුන්ව බලගැන්වීම සඳහා කටයුතු කිරීමට බලවත් ප්‍රයත්නයක් දරනවා ඇත.

## B.9 ඉලක්කගත පොලිස් සහ පොලිස් නිලධාරීන්ගේ දූෂණය

පොලිසියේ සහ පොලිස් නිලධාරීන් ගේ පවතින දූෂණය ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ ගැටලුවකි. අවාසනාවකට මෙන් මෙම කණ්ඩායම්වල නිර්ධය දූෂිත ක්‍රියා සෑම ආකාරයකින්ම තරුණයින්ට බලපෑම්කරන අතර ඔවුන්ට සුපිළිපන්භාවයෙන් යුත් ජීවිත ගතකිරීමටඔවුන්ට ඇති හැකියාව අහිමි කරවයි. මෙවැනි දූෂණයන් තරුණයන් කෙරෙහි මෙන්ම, ඔවුන්ගේ ජීවන වටිනාකම්, ආකල්ප සහ සුපිළිපන්භාවය සඳහා නැගී සිටීම කෙරෙහි සෘණාත්මක බලපෑමක් ඇති කරන බව YIS සමීක්ෂණයට අනුව පෙනීගොස් ඇත.

මෙවැනි නීච දූෂණයන් අවසන් කිරීමට TISL ආයතනය සිය ඉතිහාසය පුරාම දැඩිසේ කැපවී ඇත. ඉදිරියටම යන මෙම අරගලය සඳහා නව දැනුමක් සහ නව සම්පත් සපයමින් YIS සමීක්ෂණය නව මංපෙත් විවර කර දී ඇත. දූෂිත ගනුදෙනු පිළිකෙව් කිරීමේ නව උපාය මාර්ගයන් ඇතිකිරීමටත් දූෂිත ඉල්ලීම් අවම කරමින් පොලිසිය සහ පොලිස් නිලධාරීන් අතර සුපිළිපන්භාවය ඇති කිරීමටත් තරුණයින් සමග එක්ව TISL ආයතනය කටයුතු කරනු ඇත.

නිගමන සහ නිර්දේශ

# පසු සටහන්

1. රජයේ නිල සංඛ්‍යා අනුව 2012 දී දල ජාතික නිෂ්පාදනයේ වර්ධනය 6.5%ක් විය. 2008 ලෝක ආර්ථික අවපාතය හමුවේ මෙය ශක්තිමක් ආර්ථික ප්‍රතිසාධනයකි. එමෙන්ම දල ජාතික නිෂ්පාදනයට කර්මාන්ත අංශයෙන් ලද දායකත්වයේ සකස්කළ අගය 10% වූ අතර මෙය අනාගත වැටුප් සහ ආදායම් වර්ධනයේ ශක්තිමත් පසුබිමකි.(http://www.sttistics.gov.lk/national _accounts/ press%20 release/gdp%20summary%20 indicators%202012%20annula.pdf බලන්න.)

2. පළාත් මට්ටමෙන් නියෝජනය කළ තරුණ සහ වැඩිහිටි සංඛ්‍යාවන් සහ ප්‍රතිශතයන් පහත දක්වා ඇත:

| පළාත | තරුණ | | වැඩිහිටි | | එකතුව | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| මධ්‍යම | 55 | 5.5 | 55 | 5.4 | 110 | 5.5 |
| නැගෙනහිර | 109 | 10.9 | 92 | 9.1 | 201 | 10.0 |
| වයඹ | 107 | 10.7 | 117 | 11.6 | 224 | 11.1 |
| උතුරු මැද | 64 | 6.4 | 62 | 6.1 | 126 | 6.3 |
| උතුරු | 45 | 4.5 | 47 | 4.6 | 92 | 4.6 |
| සබරගමුව | 162 | 16.1 | 160 | 15.8 | 322 | 16.0 |
| දකුණ | 73 | 7.3 | 75 | 7.4 | 148 | 7.3 |
| ඌව | 54 | 5.4 | 64 | 6.3 | 118 | 5.9 |
| බටහිර | 335 | 33.4 | 340 | 33.6 | 675 | 33.5 |
| එකතුව | 1004 | 100.0 | 1012 | 100 | 2016 | 100.0 |

පළාත් 10න් තෝරාගත් තරුණ හා වැඩිහිටි සහභාගීවූවන් ගේ නියැදිය විසිර සිටි ආකාරය.




රූපසටහන:සහභාගීවූවන් ගේ නියැදිය, නාගරික සහ ග්‍රාමීය වශයෙන්

3. රජයේ නිල සංඛ්‍යාන අනුව වඩා නාගරික පළාත් (දකුණු සහ බස්නාහිර පළාත්) රටේ මධ්‍යම, උතුරු හා නැගෙනහිර කොටසේ වඩා ග්‍රාමීය පලාත් හා සසඳන විට ඉතා සැලකියයුතු වෙනසක් පෙන්වයි. ග්‍රාමීය පළාත්වල කාන්තා විරැකියාව ඉතා ඉහලය, එමෙන්ම සමස්ථයක් වශයෙන් ග්‍රාමීය ජනයා කායිකව ශ්‍රමය යෙදිය යුතු සහිත රැකියා (කෘෂිකර්මය වැනි) වල නිරත වෙති. වාහන අයිතිය, ආහාර පිසීම සඳහා දර භාවිතය, නල ජල පහසුකම් වැනි මූලික දර්ශක වලින් පවා නාගරික සහ ග්‍රාමීය ප්‍රදේශ අතර ප්‍රධාන වෙනස්කම් පෙන්වයි. මෙම වෙනස්කම් 30% සිට 50% දක්වා වේ.
පළාත් අතර සමාජ ආර්ථික සංඛ්‍යානයන්ගේ පූර්ණ විග්‍රහයක් සඳහා http://www.cbsl.gov.lk/pics_n_docs/10_pub/_docs/statistics/other/socio_econ_%20data_2011_e.pdf වෙබ් අඩවිය බලන්න.

4.සාපේක්ෂ වශයෙන් ස්ත්‍රී පුරුෂ භේදයෙන් තොර බලගැන්වීම පිළිබඳව ශ්‍රී ලංකාවේ ශක්තිමත් නීති පවතින අතර ලිංග ස්ත්‍රීපුරුෂ භේදයෙන් තොර අධ්‍යාපන අවස්ථා ගැන යහපත් වාර්තාවක් ඇත. එසේනමුත් එදිනෙද සැබෑ තත්ත්වයන් යටතේ, විශේෂයෙන්ම දුගී බව නිසා හෝ වෙනත් අයුරකින් කොන්වී සිටින කාන්තාවන් හා සම්බන්ධයෙන් තවමත්  අසමාන ලිංගික සබඳතා ගැටලු සහිත  ජාතියක් බවට පත්වී ඇත. රැකියා සම්බන්ධයෙන් කාන්තාවන් අවාසිදායක තැනක සිටින අතර නිවසේදී සමතැන ලබාග ැනීම සඳහාද දැඩි ප්‍රතිරෝධයකට මුහුණ දෙයි. රටතුළ අවතැන්ව සිටින කාන්තාවන් විශේෂයෙන්ම අපහසු අභියෝගවලට මුහුණ දෙති. නිදසුනක් ලෙස යුද්ධයෙන් හානිවූ පළාත්වල රැකියා අවස්ථා ලැබී ඇති කාන්තාවන්ගේ සංඛ්‍යාව ඉතා කුඩාය. නිදසුනක් ලෙස, උතුරු පළාතේ කාන්තා රැකියා නියුක්තිය 14%කි. (පහත සඳහන් වෙබ් අඩවියෙන් ලබාගත හැකි ශ්‍රී ලංකා රජයේ නිල සංඛ්‍යා ලේඛන බලන්නඃ http://www.cbsl.gov.lk/pics_n_docs/10_pub/_docs/statistics/other/socio_econ_%20data_2011_e.pdf ).

මෙහි ප්‍රතිඵලයක් වශයෙන් කාන්තාවන්ගේ එදිනෙද අත්දැකීම් ඔවුන්ගේ පිරිමි සමානයන්ට වඩා වෙනස්ය. ඔවුන් අද්විතීය සංස්කෘතික අත්දැකීම් ලබාගෙන ඇති අතර YIS සමීක්ෂණයෙහි දැක්වෙන ඔවුන්ගේ වෙනස්වූ ප්‍රතිචාරයන් ඒ අනුව වටහාගත යුතුය.

ශ්‍රී ලංකාවේ ස්ත්‍රීපුරුෂ සමාජ භාවය පිළිබඳ තොරතුරු විස්තර සඳහා “Sri Lanka gender Assesment, Asian Developmnet Bank, 2008” වාර්තාව බලන්න. (මෙය http// www2.adb.org/ documents/ reports/cga-sri.pdf වෙබ් අඩවියේ ඇතුළත්ය). එමෙන්ම, “SwarnaJayaweera & Chandra Gunawardena, Social Inclusion:Gender and Equity in Education Swaps in South Asia,Sri lankan Case Study. Unitied nations Children’s Fund Regional Office for South Asia.” වාර්තාවද බලන්න.

(මෙය http://www.unicef.org/rosa/unicef_rosa%28srilanka_case_study%29.pdf වෙබ් අඩවියේ ඇතුළත්ය).

5.ග්‍රාමීය ජනතාව ප්‍රාදේශීය පරිපාලන ආයතන සහ පොලිස් සේවා මට්ටමෙන් දූෂණ ඉල්ලීම් වලට නිතතුරුවම ලක්වන බව TISL ආයතනයේ 2010 ජාතික පරිපූර්ණත්ව සමීක්ෂනයෙන් සහ පුරවැසි වාර්තා පත් (2011) මගින් හෙළිවිය. http://www.tisrilakna.org. වෙබ් අඩවියෙන් තවත් තොරතුරු ලබාගත හැකිය.

6. ශ්‍රී ලංකාවේ රාජ්‍ය නිලධාරීන් බොහොමයක් සම්බන්ධයෙන් ගැඹුරු අවිශ්වාසයක් සහ කලකිරීමක් ඇති බව TISL ආයතනයේ 2010 ජාතික සුපිළිපන් සමීක්ෂණයෙන් හෙළිවිය. මෙම තත්වයන් ප්‍රාදේශීය පරිපාලන ආයතන හා පොලිසිය සම්බන්ධයෙන් වඩා තීර්ව විය. ජාතික සුපිළිපන් සමීක්ෂණය පිළිබඳ සම්පූර්ණ ප්‍රතිඵල සඳහා කරුණාකර http://www.tisrilakna.org/pub/ reports/NIS_SL_2010.pdf වෙබ් අඩවිය බලන්න.

7. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය විසින් 2012 මාර්තු මාසයේදී ශ්‍රී ලංකාවේ තිබූ සිවිල් යුද්ධයේ අවසාව දිනවල සිදුවූ බවට චෝදනා එල්ලවන යුධ අපරාධ පිළිබඳව පරීක්ෂණයක් කරන ලෙස ශ්‍රී ලංකා රජයෙන් ඉල්ලා සිටින යෝජනාවක් සම්මත කර ගන්නා ලදී. මෙම යෝජනාව, යුද්ධයේ අවසාන අවස්ථාවේදී දෙමළ සරණාගතයින්ට සැලකූ ආකාරය පිළිබඳව රජය ජාත්‍යන්තර වශයෙන් ගර්හාවට පත්කිරීමේ එක් පියවරකි.  මේ පිළිබඳ විස්තර සඳහාඃ Human Rights Watch, 2013, Sri lanka Chapter (Available at http://www.hrw.org/world-report 2013/country-chapters /sri-lanka): Sri Lanka’s Authoritarian Turn: The Need for International Action.Asia Report No.243 Feb. 2015. බලන්න.

8. මාධ්‍ය පිළිබඳ රාජ්‍ය නොවන සංවිධානයක් වන ‘නිදහස් නිවස’ (Freedom House)  සංවිධානයට අනුව 2011 වසරේදී ශ්‍රී ලංකාවේ අන්තර් ජාල ග්‍රාහකයන් (penetrations) 15%ක් විය. මෙම සංඛ්‍යාව වැඩිවෙමින් පවතී. සමාන ආර්ථික මට්ටම් සහිත රටවල් අතර පවා මෙවැනි පහත් මට්ටමේ අන්තර්ජාල ග්‍රාහනයන් අසාමාන්‍යය.

# සුපිළිපන්භාවය හා තාරුණ්‍යය

## සමීක්ෂණ වාර්තාව

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල්
185/5, හයිලෙවල් පාර, කොළඹ 6, ශ්‍රී ලංකා
දුරකථන : 011 4369781 - 3
ෆැක්ස් : 011 2506419
ඊ-මේල් : tisl@tisrilanka.org
වෙබ් : www.tisrilanka.org

9 789551 281595